- සිසුහු විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පැවති Tec-Ex ප්‍රදර්ශනයට සහභාගිත්වයෙන් හා සංවිධානයෙන් හවුල් වූහ.

6 අඛණ්ඩ අධ්‍යයන අංශය

අඛණ්ඩ අධ්‍යාපන අංශය (CEC) විශ්ව විද්‍යාලයේ ආරම්භයේ සිටම ඩිප්ලෝමා, සහතික, කෙටි පාඨමාලා, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සහ වෙනත් ව්‍යාප්ති වැඩසටහන් සම්බන්ධීකරණය හා මෙහෙයවීම සිදු කරයි. මෙය පාර්ලිමේන්තු පනත මගින් බලගන්වනු ලැබ ශ්‍රී ලංකාවේ ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයෙහි පූර්ව ආයතනයේ කටයුතු අඛණ්ඩව කරගෙන යන විශ්ව විද්‍යාල හස්තයයි.

කෙටිකාලීන වෘත්තීය සංවර්ධන වැඩසටහන් අතර, පුහුණුකරුවන් පුහුණු කිරීම (ToT) සහ තක්සේරුකරුවන්ගේ පුහුණු කිරීම (ToA) ක්ෂේත්‍රයේ ඉල්ලුම හා අත්‍යාවශ්‍යතාවය මත පදනම්ව පවත්වනු ලැබේ. මේවා නිර්මාණය කර ඇත්තේ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු කිරීම් (TVET) අංශයේ කර්මාන්තයේ සහ ඉගැන්වීමේ ක්ෂේත්‍රයේ පුද්ගලයන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා ය. මෙම වැඩසටහන් වල කාලසීමාව කුඩා වුවද, මේවා වඩාත් ප්‍රායෝගික වන අතර වැඩ පරිසරය සැබෑ අත්දැකීම අත්විඳීමට අවස්ථාව ලබා දේ.

6.1 ඩිප්ලෝමා වැඩ සටහන්

වගුව 6.1: ඩිප්ලෝමා වැඩ සටහන්

ඩිප්ලෝමා වැඩ සටහන	NVQ මට්ටම	ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව
කාර්මික ගුරු අධ්‍යාපන ජාතික ඩිප්ලෝමාව	5	102
පුහුණු මධ්‍යස්ථාන කළමනාකරණ උසස් ජාතික ඩිප්ලෝමාව	6	30

6.2 කෙටිකාලීන වැඩ සටහන්

6.2.1 තක්සේරුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් (TOA)

වාර්ෂික ඉලක්කය - 250

වගුව 6.2: තක්සේරුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්

	සහතිකය	කාල සීමාව	සහභාගී වන්නන් සංඛ්‍යාව	ඉලක්කය
01	ToA 106	11/03/2019 -15/03/2019	34	40
02	ToA 107	25/03/2019-29/03/2019	33	44
03	ToA 108	10/06/2019-14/06/2019	28	42
04	ToA 109	22/07/2019-27/07/2019	31	47
05	ToA 110(දෙමළ මාධ්‍යය)	05/08/2019-09/08/2019	34	43
06	ToA 111	05/08/2019-09/08/2019	40	42
07	ToA 112	16/09/2019-20/09/2019	27	50
08	ToA 113 (5 මට්ටම)	30/09/2019-04/10/2019	21	42

09	ToA 114	07/10/2019-11/10/2019	30	40
10	ToA 115	28/10/2019-01/11/2019	17	50
	එකතුව		**295**	**440**

6.2.2 TVET අංශයේ ගුණාත්මක නායකයන් සංවර්ධනය කිරීම

ඉලක්කය 125

වගුව 6.3: TVET අංශයේ ගුණාත්මක නායකයන් සංවර්ධනය කිරීම

	සහතිකය	**කාල සීමාව**	**සහභාගි වන්නන්**
01	තත්වය	24/07/2019-25/07/2019	17
02	තත්වය	22/08/2019-23/08/2019	29
03	තත්වය	19/09/2019-20/09/2019	34
04	තත්වය	24/10/2019-25/10/2019	22
	එකතුව		**102**

7 බඳවා ගැනීම,ප්‍රතීතනය හා තත්ව සහතික අංශය

7.1 හැඳින්වීම

2014 සැප්තැම්බර් මාසයේ දී බඳවා ගැනීම්, ප්‍රතීතන සහ තත්ව පාලන අංශය (AAQA) ස්ථාපිත කරන ලදී. එහි පළමු වසර තුළ අතුරු ව්‍යවස්ථා, රෙගුලාසි, රීති සහ ක්‍රියා පටිපාටි වැනි දැනට පවතින අවශ්‍ය ලේඛන සංවර්ධනය කිරීම හා එහි දෙවන වසර තුළ දී විශ්ව විද්‍යාලයට ඇතුළත් කර ගන්නා සිසුන් ගණන වැඩි කර ගැනීම,ප්‍රතීතන ක්‍රියාවලි සහ තත්ව සහතික කිරීම ආරම්භ කිරීම පිලිබඳව ක්‍රමයෙන් අවධානය යොමු කරන ලදී.

7.2 සංක්ෂිප්ත තත්ව සහතිකකරණ රාමුව

වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයට (UNIVOTEC) තත්ව සහතික කිරීමේ රාමුවක් පවතී. රාමුවෙහි ලක්ෂණ සහ කාර්යයන් පහත සඳහන් ක්ෂේත්‍ර හරහා විශ්ව විද්‍යාලයේ ගුණාත්මකභාවය තහවරු කරයි:

i. උපාධි පිරිනැමීමේ ආයතනයක් සඳහා නෛතික අවශ්‍යතා පිළිබඳව පොදු පිළිගත් ප්‍රමිතීන්.
ii. භෞතික සම්පත් පිළිබඳ ප්‍රමිතීන්
iii. උපාධි වැඩසටහන් වල ප්‍රමිතීන්
iv. විශ්ව විද්‍යාලයේ ගුරුවරුන්ගේ හැකියාවන් සහ සුදුසුකම්
v. පර්යේෂණ කියාකාරකම්
vi. අධ්‍යාපනික වැඩසටහන් බෙදා හැරීමේ මාර්ග
vii. ඇගයුම් ක්‍රියා පටිපාටි
viii. ශිෂ්‍ය සුභසාධනය

2008 අංක 30 දරණ පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය,විශ්ව විද්‍යාලයක් ලෙස, ශ්‍රී ලංකාව තුල උපාධි පිරිනැමීමේ ආයතනයක් ලෙස කටයුතු කිරීමට නීතිමය අවශ්‍යතාවයන් ආවරණය කරයි. එය විශ්ව විද්‍යාල නිල වෙබ් අඩවිය තුල පහත පරිදී හඳුන්වා දී ඇත.

"2008 වර්ෂයේ අංක 31 දරණ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනත යටතේ ස්ථාපනය කරන ලද වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ වෙනත් ඕනෑම ජාතික විශ්වවිද්‍යාලකටම සමාන නීතිමය හා ශාස්ත්‍රාලීය තත්ත්වයන් දරයි. රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන අංක 16/92 හි 6 සහ 7 වගන්තිවලට අනුව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන උපාධි, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති විශ්ව විද්‍යාල වලින් නිකුත් කරනු ලබන උපාධි හා සමානව සලකනු ලබන අතර, මෙම විශ්ව විද්‍යාල පොදු රාජ්‍ය මණ්ඩලයේ විශ්ව විද්‍යාල සංගමයේ සහ/හෝ ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සංගමයේ ලැයිස්තුගත කර ඇත.

විශ්ව විද්‍යාලය වැඩිදියුණු කිරීමට අවශ්‍ය අවශ්‍යතා වලට අනුකූලව පරිපාලන ගොඩනැගිල්ල,දේශන ශාලා,පුස්තකාලය,රසායනාගාර,ශ්‍රවණාගාරය,ආපනශාලා සහ නේවාසිකාගාර අන්තර්ගතව අත්‍යවශ්‍ය යටිතලපහසුකම් ස්ථාපිත කර කර ඇති අතර, සංවර්ධනය කිරීම සිදු කරනු ලැබේ.

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මූලික අරමුණ වන ප්‍රමිතීන් සහිත උපාධි වැඩසටහන් තත්ව පාලන කමිටුව මඟින් සිදුකරන කාර්යයන් මගින් ආරක්ෂණය කරනු ලැබේ.

ඉහත සඳහන් කල පනත මඟින් මෙම විශ්ව විද්‍යාලයේ නිළධාරීන්,ඔවුන්ගේ වගකීම් සහ පරිපාලන පිරිස් සඳහා අනෙකුත් විශ්ව විද්‍යාලවල එම පිරිස් කොට්ඨාශ වලට සමාන්තරව සාමන්‍ය ප්‍රමිතීන්වලට අනුකූලව අධ්‍යන වැඩසටහන් පවත්වාගෙන යාමට නියම කර ඇත.

විශ්ව විද්‍යාලයේ නිළධාරීන් පහත පරිදි වේ;

I. උපකුලපති
II. පීඨාධිපතිවරු
III. අධ්‍යක්ෂ ජෙනරාල්
IV. අධ්‍යක්ෂ මූල්‍ය
V. අධ්‍යක්ෂ ජනමාධ්‍ය හා තොරතුරු
VI. අධ්‍යක්ෂ බඳවා ගැනීම, ප්‍රතීතනය හා තත්ව සහතිකකරණය

පරිපාලන ආයතන වන්නේ;

I. පාලක මණ්ඩලය
II. අධියන සභාව
III. ප්‍රවේශය,ප්‍රගතීතන හා තත්ව සහතික කිරීමේ සභාව
IV. පීඨ මණ්ඩලය (ඉහත සඳහන් ආයතනවල සංයුතිය එකී පනතේ පැහැදිලිව සඳහන් කර ඇත)

අවශ්‍ය කරන ප්‍රමිතිය සහතික කිරීමට මෙම ආයතනවල කාර්යයන් කෙටියෙන් විස්තර කර ඇත. කර්මාන්ත සහ වෘත්තීය තාක්ෂණ පීඨය,පුහුණු තාක්ෂණ පීඨය යන පීඨ දෙක යටතේ, අධ්‍යයන වැඩසටහන් පවත්වනු ලැබේ. විෂය ඒකක,ඉගැන්වීමේ ක්‍රම,විභාග,ඇගයීම් ඇතුළුව අධ්‍යයන පාඨ මාලා වලට අදාල වන සියළු ගැටළු පිළිබඳව පීඨ මණ්ඩලවලදී සාකච්ඡා කරනු සහ අධීක්ෂණය කරනු ලැබේ.
පීඨ මණ්ඩලවලදී ගනු ලබන නිර්දේශ හා තීරණ අධ්‍යන සභාව අනුමැතිය සඳහා යොමු කරනු ලැබේ. අධ්‍යයන කවුන්සිලය මඟින් ගැටළු වල තත්වය සහ ප්‍රමාණය පදනම් කර ගෙන පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගනු ලැබේ. සංයුතිය සහ කාර්යයන් සැලකිල්ලට ගත් කළ අධ්‍යයන සභාව ශ්‍රී ලංකාවේ අනෙකුත් සාම්ප්‍රදායික විශ්ව විද්‍යාලවල සනාතන සභාවලට සමාන වේ.

විශ්ව විද්‍යාල අධ්‍යයන ආයතනවලට අදාළව, ඇතුළත් කර ගැනීමේ ක්‍රියා පිළිවෙළ ,අධ්‍යයන වැඩසටහන් ප්‍රතීතනය කිරීම,බඳවා ගැනීමේ පටිපාටි,අධ්‍යයන සහ පරිපාලන ගැටළු පිළිබඳව සහ විශ්ව විද්‍යාල විද්‍යායතන සාමාන්‍ය තත්ව සහතික කිරීමේ ක්‍රියාදාමයන් පිළිබඳව සාකච්ඡා කිරීමට අවශ්‍ය වන විටදී බඳවා ගැනීම්,ප්‍රතීතන සහ තත්ව පාලන කවුන්සිලය වෙත යොමු කරනු ලැබේ.
විභාග පැවැත්වීම සහ අධීක්ෂණය කිරීම,උත්තර පත්‍ර සලකුණු කිරීම ප්‍රතිඵල සටහන් කිරීම සහ සහතිකපත්‍ර නිකුත් කිරීමට අදාල වගකීම විශ්ව විද්‍යාලයේ විභාග සහ ඇගයීමේ මධ්‍යස්ථානයට පැවරී ඇත.මෙහි ක්‍රියා පටිපාටිය ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්වවිද්‍යාලවලට සමානය.

විශ්ව විද්‍යාලයේ ක්‍රියාත්මක තත්ව සහතික කිරීමේ කමිටුව (QAC) මාසිකව රැස් වන අතර එමඟින් අපේක්ෂිත තත්වයන් සහ ප්‍රමිතීන් යටතේ අධ්‍යන වැඩසටහන් පවත්වාගෙන යාමට මූලපිරීම සහ ඒ සඳහා අදාළ පහසුකම් සහ ශිෂ්‍ය සුබසාධනය වැඩිදියුණුකිරීම සිදු කරයි. මෙම කමිටුව මඟින් මාසිකව ප්‍රගති වාර්තාවක් අධ්‍යයන කවුන්සිලය වෙත යොමු කරනු ලැබේ.

ඉහත සඳහන් නිලධාරීන් හා ආයතනවල සියලුම කාර්යයන් පාලනය කරනු ලබන්නේ විශ්ව විද්‍යාලය මඟින් අනුමත කරන ලද සහ වැඩිදියුණු කරමින් පවතින අතුරු ව්‍යවස්ථා,රෙගුලාසි,නීති,ක්‍රියා පටිපාටි සහ ප්‍රතිපත්ති මාලාව මඟිනි.
එම ලේඛනවල අන්තර්ගතය පහත පරිදී වේ:

අතුරු ව්‍යවස්ථා

- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය මගින් උපාධි, පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ උසස් උපාධි පිරිනැමීම සඳහා අතුරු ව්‍යවස්ථාව.
- විභාග පැවැත්වීම, වැරදි, දඬුවම් සහ අභියාචනා ක්‍රියාවලිය සඳහා අතුරු ව්‍යවස්ථාව.
- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ සිසුන්ගේ රැස්වීම සඳහා අතුරු ව්‍යවස්ථාව.
- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ නේවාසික හා ශිෂ්‍ය විනය සඳහා අතුරු ව්‍යවස්ථාව.
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මගින් ප්‍රවීණතාව, මූලික සහතික, සහතික, උසස් සහතික, ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා ප්‍රදානය කිරීම සඳහා අතුරු ව්‍යවස්ථාව.
- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවයේ ක්‍රියා පටිපාටිය සඳහා අතුරු ව්‍යවස්ථාව.
- වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය යටතේ ස්ථාපිත විද්‍යායතනවල ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයේ ක්‍රියා පටිපාටිය සඳහා අතුරු ව්‍යවස්ථාව.

රෙගුලාසි

- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය මගින් තාක්ෂණික අධ්‍යාපනවේදී උපාධි පිරිනැමීම සඳහා වූ රෙගුලාසි.
- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය මගින් තාක්ෂණවේදී උපාධිය පිරිනැමීමේ රෙගුලාසි.
- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය මගින් ප්‍රවීණතා සහතික,මූලික සහතික, උසස් සහතික, ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා ප්‍රදානය කිරීම සඳහා වූ රෙගුලාසි.

නීති

- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය මගින් තාක්ෂණික අධ්‍යාපනවේදී උපාධි පිරිනැමීම සඳහා වූ නීති.
- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය මගින් තාක්ෂණවේදී උපාධිය පිරිනැමීමේ නීති.
- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ පීඨාධිපතිවරයෙකු තෝරා ගැනීම සඳහා වූ නීති.
- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ අභියාචනා මණ්ඩලයේ කටයුතු පවත්වාෙගන යාම සඳහා නීති
- වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය මගින් ප්‍රවීණතා සහතික,මූලික සහතික, උසස් සහතික, ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා ප්‍රදානය කිරීම සඳහා වූ නීති.

ක්‍රියා පටිපාටි

- ක්‍රියා පටිපාටිය-ඇතුළත් කර ගැනීම සහ ලියාපදිංචි කිරීම.
- ක්‍රියා පටිපාටිය-නිදහස් කිරීම්.
- ක්‍රියා පටිපාටිය-පිළිතුරුපත් සහ ප්‍රතිඵල නැවත පරීක්ෂා කිරීම
- අධ්‍යයන අංශ මට්ටමින් විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධ ක්‍රියා පටිපාටිය

ප්‍රතිපත්ති

- ආපසු ගෙවීමේ ප්‍රතිපත්තිය

7.3 ප්‍රතීතනය

පහත දැක්වෙන උපාධි වැඩසටහන් 2017 ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ප්‍රතීතනය ලබා ගන්නා ලදී.

- මෙකාට්‍රොනික්ස් තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය
- ගොඩනැගිලි සේවා තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය
- නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ තාක්ෂණවේදී උපාධිය

පළමු හා දෙවන වැඩ සටහන්වලට ලැබූ නිර්දේශ අනුව මීළඟ සමාලෝචනය සඳහා කටයුතු සූදානම් කෙරෙමින් පවතී. ඉදිකිරීම් තාක්ෂණය සහ සම්පත් කළමනාකරණය හා ප්‍රමාණ සමීක්ෂණය ප්‍රතීතනය සඳහා IESL හා IQSSL වෙත අයදුම් කිරීමට සූදානම් වේ.

7.4 තත්ව සහතිකකරණය

මෙය විශ්ව විද්‍යාලයේ ඇතුළත් කිරීම, ප්‍රතීතනය සහ තත්ත්ව සහතික කිරීමේ අංශය විශ්ව විද්‍යාලයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සම්බන්ධ වැඩසටහන් මෙන්ම නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන වැඩසටහන් සඳහා ක්‍රියාකාරීව සහභාගී වේ.

අධ්‍යාපන ආයතනයක ගුණාත්මකභාවය සෘජුවම ඉහළ නංවන ප්‍රවෘත්ති ලිපි, විෂය සමගාමී ක්‍රියාකාරකම්, පර්යේෂණ සම්මන්ත්‍රණය, සෞන්දර්යාත්මක වැඩසටහන් වැනි ක්‍රියාවලි, කාර්යයන් සහ සිදුවීම් සඳහා මෙම අංශය ක්‍රියාකාරීව සහභාගී විය.

7.5 කාර්මික වෘත්තීය අධ්‍යාපන පුහුණු කිරීම් අංශයේ (TVET) අංශයේ ගුණාත්මකබව ඉහළ නැංවීමට නායකත්වය සැපයීම

තත්ත්ව වැඩිදියුණු කිරීමේ පද්ධතිය (QIS) හඳුන්වා දීමේදී නිපුණතා අංශ සංවර්ධන ව්‍යාපෘතියේ අනුග්‍රහය ඇතිව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව සමඟ විශ්ව විද්‍යාලය ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි.

8 ආයතන ඒකකය

අධ්‍යයන හා අනධ්‍යයන ආයතන ඒකකය අංශය විශ්වවිද්‍යාලය සුමටව පවත්වාගෙන යාමට පහසුකම් සපයන අතරම විශ්ව විද්‍යාලයේ අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණය කරයි. මෙහි මූලික කාර්යයන් වන්නේ,

- වාර්ෂික මිනිස් බල සැලසුම් කිරීම
- පුරප්පාඩු පිරවීම
- බඳවා ගැනීමේ ක්‍රියාවලිය
- ප්‍රතිලාභ කළමනාකරණය
- වාර්ෂික කාර්ය සාධනය ඇගයීම
- මානව සම්පත් හා කුසලතා සංවර්ධනය
- පර්යන්ත ප්‍රතිලාභ කළමනාකරණය
- කර්මාන්ත සම්බන්ධතා

මෙම අංශය පවත්නා මානව සම්පතින් උපරිම ප්‍රයෝජන ගැනීම හා කුසලතා පූර්ණ මානව සම්පත් බඳවා ගැනීමට උපාය මාර්ගික පියවර ගැනීමත්, විශ්වවිද්‍යාල ප්‍රජාවට පහසුකම් සැපයීමත් ඵලදායි යහපත් සේවා ස්ථානයක් තහවුරු කිරීමත් කරයි.

8.1 නව බඳවා ගැනීම් -2019

බඳවා ගැනීම් සම්බන්ධ නිසි බලධාරියා වන පාලක මණ්ඩලය මඟින් පහත 2019 බඳවා ගැනීම් සාරාංශය ලෙස අනුමත කරන ලදී.

වගුව 8.1: නව බඳවා ගැනීම් - 2019

#	නම	තනතුර	පත්වීමේ දිනය
1.	ආර් පී යද්දෙහිගේ මයා	ශිල්ප ප්‍රදර්ශක	26/02/2019
2.	ඒ හංසප්‍රියා මෙය	ශිල්ප ප්‍රදර්ශක	26/03/2019
3.	ඩබ් එම් එල් යූ වන්දෙස්න	ශිල්ප ප්‍රදර්ශක	30/04/2019
4.	යූ ආර් එස් ජයවර්ධන මෙය	ශිල්ප ප්‍රදර්ශක	15/05/2019
5.	කේ යූ එම් ද සිල්වා මෙය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය **II**	15/03/2019
6.	පී එම් පෙරේරා මෙය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය **II**	22/04/2019
7.	එම් ජී ඩී උමයංගනී මෙය	කළමනාකාර සහකාර	04/06/2019
8.	ඩී එම් මුණසිංහ මෙය	කළමනාකාර සහකාර	04/06/2019
9.	ඩී එම් එස් ආර් විජේකෝන්	කළමනාකාර සහකාර	01/08/2019
10.	කේ එල් කොඩිතුවක්කු මයා	සහකාර නිලධාරී	01/08/2019
11.	එල් කේ එන් ප්‍රනාන්දු මිය	ශිල්ප ප්‍රදර්ශක	02/09/2019



රූප සටහන 8.1: බඳවා ගැනීම් සාරාංශය 2019

විශ්වවිද්‍යාලයෙහි අනුමත සේවක සංඛ්‍යාව අධ්‍යයන තනතුරු 56 කින් සහ අනධ්‍යයන තනතුරු 147 කින් සමන්විත වේ. 2019 වර්ෂය ආරම්භයේදී පුරප්පාඩු 20 ක් පැවති අතර වර්ෂය තුළ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය පරිදි පුරප්පාඩු 11 ක් පුරවන ලදී.

8.2 ඉල්ලා අස්වීම්/තනතුරු හිස් කිරීම්/ ගිවිසුම් අවසන් කිරීම හා සේවයෙන් විශ්‍රාම ගැනීම් 2019

2019 වසරේදී, කාර්ය මණ්ඩලයේ විවිධ තොරතුරු සහිත 11 දෙනෙක් විශ්වවිද්‍යාල සේවය හැරයාමට සිය ඉල්ලා අස්වීම් බාර දුන්හ. එක් නිලධාරියෙක් සිය ගිවිසුම්ගත කාලය සම්පූර්ණ කළේය. එක් කාර්ය සහායකයෙක් සිය කැමැත්තෙන් තනතුර හිස් කළේය. ලිපිකරු සේවයේ හා ප්‍රාථමික මට්ටමේ සේවකයෝ දෙදෙනෙක් විශ්‍රාම ගත්හ. අදාළ සාරාංශය වගුව: 8.2 හි දැක්වේ.

වගුව 8.2: සේවයෙන් ඉල්ලා අස්වීම්/ තනතුර හිස් කිරීම්/ගිවිසුම් අවසන් කිරීම් හා සේවයෙන් විශ්‍රාමගැනීම් සාරාංශය – 2019

	නම	තනතුර	පත්වීම් දිනය	අස් වූ දිනය	හේතුව
1.	ඩබ් කේ ලංකාපුර මයා	ශිල්ප ප්‍රදර්ශක	16/03/2018	15/03/2019	ගිවිසුම්ගත කාලය සම්පූර්ණ කිරීම
2.	කේ එම් පී බී එන් පෙරේරා	ශිල්ප ප්‍රදර්ශක	04/09/2018	31/01/2019	ඉල්ලා අස්වීම
3.	එස් ඒ රංජිත් මයා	කළමනාකරණ සහකාර	12/07/1999	04/04/2019	විශ්‍රාම ලැබීම
4.	කේ පී ඒ ජී ද සිල්වා මෙය	ආශ්‍රිත නිලධාරී	19/07/2005	30/04/2019	ඉල්ලා අස්වීම
5.	එන් ඩබ් කේ ඕපාත මෙය	කථිකාචාර්ය (ආධුනික)	03/10/2014	14/04/2019	ඉල්ලා අස්වීම
6.	ඩී එස් හෙට්ටිආරච්චි	අධ්‍යක්ෂ (MIS)	20/10/2011	30/04/2019	ඉල්ලා අස්වීම
7.	කේ එම් එස් ඒ ඩී බණ්ඩාර මයා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යII	04/07/2013	04/07/2019	ඉල්ලා අස්වීම
8.	ඒ හංසප්‍රියා මිය	ශිල්ප ප්‍රදර්ශක	26/03/2019	01/08/2019	ඉල්ලා අස්වීම

9.	ජී ජේ සඳුන් සමීර	කාර්ය සහායක	06/07/2015	09/08/2019	තනතුර හිස් කිරීම
10.	එස් එස් විදානපතිරණ මයා	කාර්ය සහායක	15/11/1999	20/08/2019	විශ්‍රාම ලැබීම
11.	පී කේ පී පුෂ්පකුමාර මයා	කථිකාචාර්ය	02/10/2017	04/10/2019	ඉල්ලා අස්වීම
12.	එම් සී එන් පෙරේරා මිය	කථිකාචාර්ය (ආධුනික)	02/10/2017	02/10/2019	ඉල්ලා අස්වීම
13.	ඩබ් කේ මොරමුදලි මිය	කථිකාචාර්ය (ආධුනික)	01/07/2016	03/10/2019	ඉල්ලා අස්වීම
14.	ආචාර්ය ඒ එම් ජසීල්	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යII	01/11/2017	01/11/2019	ඉල්ලා අස්වීම
15.	කේ යූ එම් ද සිල්වා මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යII	15/03/2019	31/12/2019	ඉල්ලා අස්වීම



රූප සටහන 8.2: 2019 *ඉල්ලා අස්වීම් සාරාංශය*

8.3 අභ්‍යන්තර උසස්වීම්

පශ්චාත් උපාධි සුදුසුකම් හා සේවා අවශ්‍යතා සපුරා ඇති පහත අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 08 දෙනා සඳහා පහත සඳහන් අභ්‍යන්තර උසස්වීම් පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මෙම සාරාංශය වගුව : 8.3. හි සවිස්තරව දැක්වේ.

වගුව 8.3: අභ්‍යන්තර උසස්වීම් - 2019

	නම	තනතුර	උසස් වීමේ දිනය
1.	ඩී එල් රණසූරිය මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II	01/03/2019
2.	යූ සිවවෙල්වි මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II	01/03/2019
3.	ආචාර්ය ජේ. වෙත්තසිංහ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II	01/03/2019
4.	මහා.ආර්.ඒ.සී ජයලත්	මහාචාර්ය	03/07/2018
5.	ආචාර්ය එම්. පී.කේ. නන්දපාල	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II	01/04/2019
6.	ආචාර්ය එස් ඩී ඒ සංජීව	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II	17/05/2019
7.	එච් පී ඒ පතිරණ මයා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II	01/02/2019
8.	ආර් ආර් එම් ඩී රත්නායක මයා	කථිකාචාර්ය	01/09/2017

ඒ අතරම සිය පරිවාස කාලය තුළ අවශ්‍ය පශ්චාත් උපාධි සුදුසුකම් හා සේවා අවශ්‍යතා සපුරා ගැනීමට අපොහොසත් වූ කථිකාචාර්ය (ආධුනික) තනතුර දැරූ ආචාර්යවරුන් හත් දෙනෙක් (07) ඔවුන්ගේ පූර්ව ස්ථිර

තනතුර වූ ඉගෙනුම් සහායක තනතුරෙහි නැවත පිහිටුවන ලදී. මෙය සිදු කරන ලද්දේ බඳවා ගැනීමේ පටිපාටියේ හා 2008 අංක 31 දරන විශ්වවිද්‍යාල පණතේ ප්‍රතිපාදන අනුව සහ නීතිපති දෙපාර්තමේන්තුවේ අදහස් විමසීමෙන් පසුවය. මෙම සාරාංශය වගුව : 8.4. හි සවිස්තරව දැක්වේ.

වගුව 8.4: පෙර ස්ථිර කරනලද පත්වීම්වල නැවත පිහිටුවීම්

	නම	නැවත පිහිටුවීම්	නැවත පිහිටුවීම් දිනය
1.	ආර් එම් සී ඒ රත්නායක මයා	ඉගෙනුම් සහායක	01/09/2019
2.	එස් ජී නම්බුවසම් මිය	ඉගෙනුම් සහායක	01/09/2019
3.	පී උරුතිරන් මයා	ඉගෙනුම් සහායක	01/09/2019
4.	ටී ආර් විදානපතිරණ මිය	ඉගෙනුම් සහායක	01/09/2019
5.	කේ ජී එන් රාජපක්ෂ මිය	ඉගෙනුම් සහායක	01/09/2019
6.	සිී ජේ අබේවික්‍රම මයා	ඉගෙනුම් සහායක	01/09/2019
7.	එස් ඒ එන් ධනුෂ්ක මයා	ඉගෙනුම් සහායක	01/09/2019

8.4 මානව සම්පත් සංවර්ධනය උදෙසා වන ප්‍රතිපත්තිය

විශ්ව විද්‍යාලයේ සාර්ථකත්වයට කාර්ය මණ්ඩලය මූලික වන බව හඳුනාගෙන ඇත. කාර්ය මණ්ඩල සංවර්ධනය සඳහා උපායමාර්ගික, වෘත්තීය ප්‍රවේශයක් විශ්වවිද්‍යාලයට තම අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය කුසලතා හා නිපුණතා සහිත ඉහළ කාර්ය මණ්ඩලයක් ආකර්ෂණය කර ගැනීමට හා රඳවා ගැනීමට උපකාරී වේ.

උපායමාර්ගික සැළැස්මේ සන්දර්භය තුළ දෙපාර්තමේන්තු හා විශ්ව විද්‍යාල අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පුද්ගලයන්ට සහ අධ්‍යයන අංශවලට පූර්ණ දායකත්වයක් ලබා දීම සඳහා කාර්ය මණ්ඩලයට සංවර්ධන අවස්ථා ලබා දීම විශ්ව විද්‍යාල ආයතනවල පූර්ණ වගකීම වේ.

විශ්ව විද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියට අනුව, කාර්ය මණ්ඩලයේ දක්ෂතා, දැනුම, හැකියාවන් සහ නිපුණතා වැඩි දියුණු කිරීම තුළින් ප්‍රාවීනය, පුහුණුව හා සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.පුද්ගලික හා වෘත්තීය වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්මාණය කර ඇති වැඩසටහන් ලබා දීමෙන්, ඔවුනට විශ්ව විද්‍යාලයට කාර්යක්ෂමතාව,ඵලදායිතාව සහ ලාභදායීතාවය වැඩි දියුණු කිරීමට හැකි වේ.

ඒ අනුව, 2019 වර්ෂයේදී විශ්ව විද්‍යාලය කාර්ය මණ්ඩල සංවර්ධනය කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කළ අතර විශ්ව විද්‍යාල ප්‍රජාවේ දැනුම, මෘදු හා දැඩි කුසලතා සහ ආකල්ප වැඩි දියුණු කිරීම සඳහා ධාරිතා වර්ධන වැඩසටහන් සඳහා කැපී පෙනෙන මුදල් ප්‍රමාණයක් ආයෝජනය කළේය. එබැවින්, ඔවුන්ගේ වෘත්තීය සංවර්ධනය සඳහා අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දේශීය හා විදේශීය පුහුණු අවස්ථා සඳහා විශ්වවිද්‍යාල අනුග්‍රහය දැක්වීය.

8.4.1 ආචාර්යවරුන් උදෙසා කෙටිකාලීන පුහුණුව - දේශීය හා විදේශීය

විශ්ව විද්‍යාලයේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම මඟින් තෝරාගත් අධ්‍යන කාර්ය මණ්ඩල සාමාජිකයින්ට නියම කරන ලද දේශීය සහ විදේශීය පුහුණුව වැඩසටහන් සඳහා සහභාගි වීමට අවස්ථාව ලබා දීමට විශ්ව විද්‍යාලයේ ශක්‍යතා සංවර්ධනය සඳහා වන අරමුදල,නිපුණතා ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා වූ අරමුදල මඟින් ප්‍රතිපාදන ලබා දෙන ලදී. 2019 වර්ෂයේ සිදුකල ප්‍රදානයන් පිළිබඳව සාරාංශය පහත වගුවල දැක්වේ.

දේශීය අරමුදල්වලින් විදේශ පුහුණුව සඳහා ලබාදෙන ප්‍රතිපාදන සීමා කිරීමට ගත් රජයේ තීරණය සමග 2018 වසරට සාපේක්ෂව සීමිත විදේශ පුහුණු සැසි සංඛ්‍යාවක් අනුමත කරන ලදී. පහත වගුවල දැක්වෙන පුහුණු සැසි සියල්ලම පාහේ යෝජිත විශ්වවිද්‍යාලිය ආචාර්යවරුන්ට පුහුණු ආයතනවලින් ලැබුණු සෘජු ප්‍රදානයන් වේ.

8.4.2 ආචාර්යවරුන්ගේ වෘත්තීය පුහුණුව උදෙසා අරමුදල්

සිය බඳවාගැනීම් පටිපාටියෙහි අවශ්‍යතා සපුරමින් වෘත්තීය සංවර්ධනය ලභා කර ගැනීමට අවශ්‍ය වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලයට ලැබියයුතු අවස්ථා මනාව හඳුනා ගන්නා අතර ඒ

සඳහා මූල්‍යාධාර පිරිනමනු ලැබේ. ජාතික විශ්වවිද්‍යාලයක ගුරු පුහුණු පාඨමාලාව සම්පූර්ණ කර නොතිබූ නව පත්වීම් ලද කථිකාචාර්යවරුන් සියලු දෙනාටම පාහේ ඔවුන්ගේ ඉල්ලීම මත පත්වීම ලබා මුල් වසර ඇතුළත එම වැඩසටහන හැදෑරීමට විශ්වවිද්‍යාලය විසින් අරමුදල් සපයන ලදී. 8.5. වගුවෙහි අදාළ සාරාංශය දැක්වේ.

වගුව 8.5: උසස් අධ්‍යාපන ඉගැන්වීම් වැඩසටහන් සහතිකපත් පාඨමාලාවට ප්‍රදානයන්

#	පුහුණු වැඩසටහන	නම	තනතුර	ආයතනය
1	උසස් අධ්‍යාපනයෙහි ඉගැන්වීම පිළිබඳ සහතිකපත් පාඨමාලාව (CTHE)	ආචා. ආර් ඩබ් එල් කොග්ගලගේ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යI	ශ්‍රී ජයවර්ධනපුර වි.වි.
2	පුහුණු වැඩසටහන	ආචා. ඒ එස් කේ වරාහේන	තනතුර	ආයතනය
3	කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන	එස් ආර් එම් සෙනෙවිරත්න මිය	කථිකාචාර්ය (ආධුනික)	කැළණිය වි.වි.
4	කා. ම. සං. සහතිකපත් වැඩ සටහන (CCSD)	මහා.චන්දන ජයලත්	මහාචාර්ය	වයඹ වි.වි.

8.4.3 සමස්ත කාර්ය මණ්ඩලය උදෙසා සංවර්ධන අවස්ථා - දේශීය

විශ්වවිද්‍යාලයීය මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියට අනුකූලව සියලුම කාර්ය මණ්ඩලයට පාහේ දැනුම, කුසලතා හා හැකියාවන් ඔප්නංවා ගැනීමට අවස්ථාව සැලසේ. අදාළ සේවාදායකයන් උදෙසා මෙම පුහුණු සැසි තෝරාගනු ලබන්නේ අංශ ප්‍රධානීන්ගේ නිර්දේශය හා වාර්ෂික වැටුප් වර්ධකයේ සමාලෝචනයන් අනුවය. විශ්වවිද්‍යාලයීය අරමුදලෙහි ධාරිතාවෙන් සැලකියයුතු කොටසක් මෙම පුහුණුවීම් උදෙසා ආයෝජනය කෙරේ. මෙහි සාරාංශය අංක 07 වගුවෙන් දැක්වේ.

අධ්‍යයන ශ්‍රේණිවල කාර්ය මණ්ඩලයට පිරිනැමූ පුහුණුවීම්:

1) ඉ -ප්‍රජාවට ඩිජිටල් සමුළු සේවා පහසුකම් සැපයීම පිළිබඳ වැඩමුලුව
2) ජාතික අපනයන ක්‍රමවේදය පිළිබඳ ප්‍රගතිය
3) ඵලදායී පර්යේෂණ යෝජනා ලිවීම පිළිබඳ වැඩමුලුව
4) අකුණු රැකවරණය පිළිබඳ වැඩමුලුව
5) වායුසමීකරණ පද්ධති සැලසුම් කිරීම පිළිබඳ වැඩමුලුව
6) ගුණාත්මක නායකත්ව වැඩ සටහන- පියවර I
7) TVET හි කර්මාන්ත සහභාගිත්ව ඇගයුමට පහසුකම් සැලසීම
8) විද්‍යුත් පරීක්ෂාව සඳහා අධෝරක්ත තාපලේඛ ක්‍රමය
9) 2020 වර්ෂය සඳහා අවශ්‍යතා ඇගයුම් පුහුණුව පිළිබඳ වැඩමුලුව
10) " ගෘහමය හා වාණිජ ගොඩනැගිලිවල LPG පද්ධති ස්ථාපනය " පිළිබඳ වැඩමුලුව
11) " පරිසර හිතකාමී කෘෂිකර්මය සහ ආහාර සැකසුම් කිරීම; යුගයේ අවශ්‍යතාවය" පිළිබඳ වැඩමුලුව
12) "Skills Passport" - හවුල්කරුවන්ගේ උපදේශනය
13) 2020 වර්ෂය සඳහා අවශ්‍යතා ඇගයුම් පුහුණුව පිළිබඳ වැඩමුලුව
14) අකුණු රැකවරණය පිළිබඳ වැඩමුලුව
15) Excel මගින් පූර්ණ සංඛ්‍යාන දත්ත විශ්ලේෂණය පිළිබඳ වැඩමුලුව
16) නව බලශක්ති ඉලෙක්ට්‍රොනික විද්‍යා පාඨමාලාව

ජ්‍යෙෂ්ඨ විධායකයන් උදෙසා වැඩමුලු:

1. රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන
2. "55 දී විශ්‍රාම යාමට එරෙහි වෙමු" සාකච්ඡා මණ්ඩපය

කනිෂ්ට විධායකයන් උදෙසා වැඩමුලු:

1. තොරතුරු පද්ධති විගණනය
2. නව උසස්වීම් ලද්දන් උදෙසා සුපරීක්ෂණ කුසලතා
3. LEARN - වාර්ෂික මහා සභා රැස්වීම
4. "චිත්තවේගික බුද්ධිය" පිළිබඳ වැඩමුලුව
5. 55 දී විශ්‍රාම යාමට එරෙහි වෙමු" සාකච්ඡා මණ්ඩපය
6. රාජ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන
7. ගුණාත්මක නායකත්ව වැඩ සටහන- පියවර I
8. ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත පුහුණු වැඩ සටහන
9. නව උසස්වීම් ලද්දන් උදෙසා සුපරීක්ෂණ කුසලතා
10. රජයේ වැටුප් ලේඛන පද්ධතිය හා රාජ්‍ය ගිණුම් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩ සටහන
11. ප්‍රසම්පාදනය පිළිබඳ තෙදින වැඩමුලුව
12. 2020 වර්ෂය සඳහා අවශ්‍යතා ඇගයුම් පුහුණුව පිළිබඳ වැඩමුලුව
13. හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් තරඟය
14. ඵලදායී පර්යේෂණ යෝජනා ලිවීම පිළිබඳ වැඩමුලුව
15. " රාජ්‍ය සේවකයාගේ ගතික භූමිකාව" දේශනය
16. "කම්කරු නීතිය හා කාර්මික සබඳතා" පිළිබඳ වැඩමුලුව
17. ගැටලු විසඳීමේ උපක්‍රම
18. " නවෝත්පාදනය හා වෙනස" දේශනය
19. රාජ්‍ය පරිපාලනය I ආයතන සංග්‍රහය

ලිපිකාර හා සමාන්තර සේවා සඳහා පුහුණු:

1. කාර්යාල කළමනාකරණය හා මූල්‍ය රෙගුලාසි
2. තොරතුරු පද්ධති විගණන
3. ගුණාත්මක නායකත්ව වැඩ සටහන- පියවර II
4. වැටුප් පරිවර්තනය පිළිබඳ වැඩමුලුව
5. ගුණාත්මක නායකත්ව වැඩ සටහන- පියවර I
6. අධීක්ෂණ කළමනාකරණය පිළිබඳ වැඩමුලුව
7. 2020 වර්ෂය සඳහා අවශ්‍යතා ඇගයුම් පුහුණුව පිළිබඳ වැඩමුලුව
8. Excel මගින් පූර්ණ සංඛ්‍යාන දත්ත විශ්ලේෂණය පිළිබඳ වැඩමුලුව
9. ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත පුහුණු වැඩ සටහන
10. කාර්මික සාමය හා සම්බන්ධතාවන්හි නෛතික ප්‍රගමනය පිළිබඳ වැඩමුලුව
11. ආයතන සංග්‍රහය හා මූල්‍ය රෙගුලාසි
12. කළමනාකරණ සහකාරවරුන් උදෙසා තොරතුරු තාක්ෂණය
13. කැබිනට් මෙමෝපත්‍ර සැකසීම හා ඉදිරිපත් කිරීම
14. වැටුප් පරිවර්තනය පිළිබඳ වැඩමුලුව
15. රාජ්‍ය පරිපාලනය I ආයතන සංග්‍රහය
16. ලේකම් පරිචය පිළිබඳ වැඩමුලුව
17. " රජයේ නිලධාරීන් හා සැලසුම්කරුවන් උදෙසා සංවර්ධන ව්‍යාපෘති යෝජනා සඳහා ව්‍යාපෘති භාරදීම් ආකෘතිය"

කාර්මික ශ්‍රේණීන් සඳහා පුහුණු:

1. ශීතකරණ හා වායු සමීකරණ ස්ථාපනය කිරීමේ තාක්ෂණය පිළිබඳ එක්දින වැඩමුලුව
2. නව බලශක්ති ඉලෙක්ට්‍රොනික විද්‍යා පාඨමාලාව

ප්‍රාථමික කාර්ය මණ්ඩලය සඳහා පුහුණු:

1. රියදුරන් සඳහා විද්‍යාත්මක, ප්‍රෙවිශම් සහගත හා ආරක්ෂාකාරී රිය පැදවීම
2. විදුලිජනක ක්‍රියාත්මක කිරීම හා නඩත්තුව
3. කාර්යාල සහායකයන්ගේ ආකල්ප හා වෘත්තිය දැනුම දියුණු කිරීමේ ව්‍යාපෘතිය



රූප සටහන 8.3: 2019 පුහුණුව ලබා දීම් සාරාංශය

විවිධ කාණ්ඩයන්ට අයත් කාර්ය මණ්ඩලයන් වෙනුවෙන් වෙන්කළ පුහුණු ප්‍රදානයන් ගැන සැලකිමේදී අධ්‍යයන, කනිෂ්ට විධායක හා ලිපිකරු සේවා සඳහා පුහුණු ප්‍රදානයන්ට අඩු ප්‍රමාණයක් කාර්මික, ප්‍රාථමික හා ජ්‍යෙෂ්ඨ විධායක කාණ්ඩයන්ට වෙන්කර ඇතිබව හෙළිදරව් විය. ජ්‍යෙෂ්ඨ විධායක කාණ්ඩයට අයත් සංඛ්‍යාව සීමිත වන අතර ඔවුන්ට පුහුණු සැසි පැවැත්වීම අපහසුය. ඉහත දැක්වූ සංඛ්‍යානමය හෙලිදරව් කිරීම සමග 2020 පුහුණු සැලැස්මේ කාර්මික හා ප්‍රාථමික කාර්ය මණ්ඩලයන්ට විශේෂ අවධානයක් දැක්වෙනු ඇත.

9. පරිපාලන අංශය හා රාජකාරි

විශ්වවිද්‍යාලයෙහි සුමට පැවැත්ම තහවුරු කිරීමට සහකාර ලේඛකාධිකාරී (පරිපාලන) ගේ සහයෙන් යුතුව අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අධීක්ෂණය යටතේ පරිපාලන ඒකකය ක්‍රියාත්මක වේ. සාමාන්‍ය පරිපාලන ඒකකය පහත අනු කොටස්වලින් සමන්විත වේ.

- ප්‍රවාහන අංශය
- නඩත්තු අංශය
- ආරක්ෂාව
- පවිත්‍රතා සේවා

9.1 ප්‍රවාහන අංශය

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ ප්‍රවාහන අංශය සිසුන්ගේ හා කාර්ය මණ්ඩලයේ රාජකාරිමය ප්‍රවාහන අවශ්‍යතා සපුරාලයි. ප්‍රවාහන අංශයේ අඛණ්ඩ සේවය තහවුරු කිරීමට අදාළ නිලධාරියා සහ රියදුරන් තිදෙනෙකුගෙන් සමන්විත සංචිතයක් ක්‍රියාත්මක වේ.

9.2 පවිත්‍රතා සේවා

විශ්වවිද්‍යාලයීය පවිත්‍රතා සේවා වාර්ෂිකව නිසි ටෙන්ඩර් පටිපාටිය අනුව බාහිර සමාගමක් විසින් සිදු කෙරේ. පවිත්‍රතා සේවා සැපයුම්කරු විශ්වවිද්‍යාලය පවිත්‍ර කරන අතර ගෙවත්ත නඩත්තු කිරීම හා නිසියාකාරව සනීපාරක්ෂක කටයුතුද සිදු කරයි. පරිපාලන අංශය මේ ගැන දිනපතා හා මාස්පතා ක්‍රමානුකූලව සොයාබලයි. එසේ මාසිකව හොඳින් සොයා බැලීමෙන් පසු ගෙවීම් ලකුණු කරනු ලැබේ. මෙමගින් විශ්වවිද්‍යාලයීය සනීපාරක්ෂක කටයුතු නිසියාකාරව ක්‍රියාත්මක වන බව තහවුරු කෙරේ.

9.3 ආරක්ෂාව

විශ්වවිද්‍යාලයීය ආරක්ෂක සේවා වාර්ෂිකව නිසි ටෙන්ඩර් පටිපාටිය අනුව බාහිර සමාගමක් විසින් සිදු කෙරේ. දිවා සේවා මුරයට ආරක්ෂක නිලධාරීන් 17 දෙනෙක්ද රාත්‍රී සේවා මුරයට ආරක්ෂක නිලධාරීන් 16 දෙනෙක්ද අයත්ය. විශ්වවිද්‍යාලයීය ආරක්ෂාව තහවුරු කිරීමට 2011 වසරේ සිට සීසීටීවී කැමරා පද්ධතියක් ක්‍රියාත්මක වේ.ආරක්ෂක සැලසුම අනුව ආරක්ෂක නිලධාරීන්ට රාජකාරි පවරනු ලැබේ.

9.4 නඩත්තු අංශය

විශ්වවිද්‍යාලයේ සියලුම ඉදිකිරීම් හා නඩත්තු කිරීම් අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අධීක්ෂණය යටතේ නඩත්තු අංශය මගින් ක්‍රියාත්මක වේ. නඩත්තු අංශය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රාග්ධන කාර්යයන්හි සාරාංශය පහත දැක්වේ.

9.4.1 ප්‍රාග්ධන කාර්ය හා සැලසුම්

සමාලෝචිත 2019 වර්ෂයේ නඩත්තු අංශය ක්‍රියාත්මක කළ ව්‍යාපෘති පහත පරිදි වර්ග කළ හැකිය.

I. 2018 වර්ෂයේ ආරම්භවී 2019 දී අවසන් වූ ඉදිකිරීම් ව්‍යාපෘති

අ) 500 KVA ස්ටෑන්ඩ්බයි විදුලි ජනකයන් සැපයීම, ස්ථාපිත කිරීම පරීක්ෂා කිරීම

මූල්‍ය ආයෝජනය රු.මි.21.3 (ලබාදුන් මුදල - VAT හැර)

II. 2017 ආරම්භ කළ කෙරෙමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති

අ) ශබ්දාගාරය හා පංතිකාමර සංකීර්ණය සැලසුම් කිරීම හාඉදිකිරීම් ඉතිරිය

මූල්‍ය ආයෝජනය රු.මි. 75 (ඇස්තමේන්තුගත ප්‍රමාණය- බදු ඇතුළුව)

III. 2019 ආරම්භ කළ 2019 අවසන් වූ ඉදිකිරීම් ව්‍යාපෘති

අ) ඉදිරි ආරක්ෂක කුටිවලට ගේට්ටු 04 ක්, මග ඇහිරීම් ගේට්ටු (Barrier Gates) 03 ක්, චතුර ටැංකිය උදෙසා ගේට්ටුවක් වෝටර් සම්ප් එක උදෙසා ගේට්ටුවක් සැපයීම හා සවිකිරීම

මූල්‍ය ආයෝජනය රු. මි.0.72 (ලබාදුන් මුදල - VAT හැර)

ආ) මූල්ය අංශයේ එක් කිරීම්, වෙනස් කිරීම් හා Shadier යන්ත්‍රයට හා විභාග අංශයේ ගබඩාවට පාටිෂන් ගැසීම

මූල්‍ය ආයෝජනය රු. මි.2.99 (ලබාදුන් මුදල - VAT හැර)

ඇ) ඉදිරි ප්‍රදේශයේ ආරක්ෂක වැටෙහි ඉදිකිරීම්

මූල්‍ය ආයෝජනය රු.මි. 0.98 (ලබාදුන් මුදල - VAT හැර)

ඈ)නේවාසිකාගාර පරිශ්‍රයේ යෝජිත ආරක්ෂක වැටට පී වී සී ආලේපිත චේන් ලින්ක් ඉදිකිරීම්

මූල්‍ය ආයෝජනය රු.මි. 1.57 (ලබාදුන් මුදල - VAT හැර)

ඉ) පාලම සඳහා යෝජිත ආරක්ෂක වැටේ ඉදිකිරීම් (Razor Barbed Wire)

මූල්‍ය ආයෝජනය රු.මි. 1.07 (ලබාදුන් මුදල - VAT හැර)

ඊ) යෝජිත මෝටර් සයිකල් නැවතුම්පල ඉදිකිරීම්

මූල්‍ය ආයෝජනය රු.මි. 0.52 (ලබාදුන් මුදල - VAT හැර)

උ) උසස් නිෂ්පාදන විද්‍යාගාරයේ යටිතල පහසුකම් දියුණු කිරීම

මූල්‍ය ආයෝජනය රු. මි. 2.1 (ලබාදුන් මුදල - VAT හැර)

ඌ) පැරණි කාන්තා නේවාසිකාගාරයේ තිර රෙදි

මූල්‍ය ආයෝජනය රු මි.0.37 (ලබාදුන් මුදල - VAT හැර)

IV. 2019 ආරම්භ කළ කෙරෙමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති

අ) ගුරු පුහුණු සංවර්ධන මධ්‍යස්ථානය (ITTD) ඉදි කිරීම සඳහා අඛණ්ඩ අධ්‍යයන අංශයට (CEC) දිගුවක් ලබා දීම

මූල්‍ය ආයෝජනය රු.මි. 13 (ලබාදුන් මුදල - VAT හැර)

V. 2020 දී ඇරඹීමට අපේක්ෂිත නව ඉදිකිරීම් ව්‍යාපෘති

අ) යෝජිත නේවාසිකාගාරය, වැඩපල හා ආපන ශාලාවේ ඉදිකිරීම්

මූල්‍ය ආයෝජනය රු.මි. 927.34 (ඇස්තමේන්තුගත ප්‍රමාණය– බදු ඇතුළුව)

10 සංශෝධිත මූල්‍ය ප්‍රකාශන

- මූල්‍ය තත්ත්ව දර්ශකය
- මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
- මූල්‍ය සංසරණ ප්‍රකාශය
- ගිණුම්කරණ ප්‍රතිපත්ති
- මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

10.1 මූල්ය තත්ත්ව ප්රකාශය

දෙසැම්බර් 31 දිනට	සටහන	2019 (රුපියල්)	2018 (රුපියල්)
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දේ	2	10,439,625	8,142,762
අත්තිකාරම්, අයවිය යුතු තැන්පතු	3	220,772	1,821,920
තොග		4,700,196	4,282,536
පෙර ගෙවීම්	4	1,717,372	3,766,438
කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම්	5	6,267,425	5,973,194
ණයගැතියෝ හා වෙනත් අයවිය යුතු දේ	6	13,328,709	68,766,541
		36,674,099	92,753,391
ජංගම නොවන වත්කම්			
ආයෝජන	7	53,509,899	44,326,577
දේපළ, පිරියත හා උපකරණ	8	1,377,263,536	1,430,609,841
සිදුකෙරෙමින් ඇති ප්රාග්ධන කාර්ය	9	332,425,919	315,118,269
අස්පෘශ්ය වත්කම්	10	1,593,635	1,383,334
		1,764,792,989	1,791,438,021
මුළු වත්කම්		1,801,467,088	1,884,191,412
බැරකම්			
ජංගමබැරකම්			
			-
ගෙවිය යුතු ගිණුම් හා වෙනත් වගකීම්	11	61,977,436	125,350,651
ආපසු ගෙවිය යුතු කෙටි-කාලීන තැන්පතු	12	9,664,160	8,998,675
කල්බදු වගකීම	13	1,963,235	
		73,604,831	134,349,326
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම	14	37,079,737	34,207,027
ආපසු ගෙවිය යුතු දිගු-කාලීන තැන්පතු	15	36,511,000	29,274,000
කල්බදු වගකීම	16	8,795,601	
		82,386,338	63,481,027
මුළු බැරකම්		155,991,169	197,830,353
මුළු ශුද්ධ වත්කම්		1,645,475,919	1,686,361,059
ශුද්ධ වත්කම්/ කොටස්හාරය			
ප්රාග්ධන දීමනා	17	1,640,989,558	1,659,079,504
ප්රත්යාගණන අතිරික්තය		29,436,320	30,242,875
සමුච්චිත අරමුදල	18	(25,569,271)	(3,563,532)
වෙනත් අරමුදල්	19	619,312	602,212
මුළු ශුද්ධ වත්කම්/ කොටස්හාරය		1,645,475,919	1,686,361,059

පිටු අංක 06 සිට 10 දක්වා ගිණුම්කරණ ප්රතිපත්ති හා පිටු අංක 11 සිට 23 දක්වා ඇති සටහන් මේ මූල්ය ප්රකාශයන්හිම කොටසක් වේ.

පිළියෙළ කලේ

ජී.ඒ.ඒ.කේ. දිල්රුක්ෂි
සහකාර මුල්යාධිකාරි
සහතිකය

ඉහත මූල්ය ප්රකාශ 2019.12.31 දිනට මෙම විශ්වවිද්යාලයේ කටයුතු පිළිබඳව හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි අතිරික්තය හෝ හිඟය පිළිබඳව සත්ය හා සාධාරණ මතයක් ලබා දෙන බව අපි සහතික කරමු.

මහාචාර්ය රංජිත් ප්රේමලාල් ද සිල්වා
නිසි බලධාරී

ඒ.පී අළුත්ගේ
අධ්යක්ෂ මුදල්

පාලක මණ්ඩලය මෙම මූල්ය ප්රකාශයන් පිළියෙළ කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම දරයි. මෙම මූල්ය ප්රකාශ අධ්යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ අතර, ඒ වෙනුවෙන් අත්සන් කරනු ලැබේ.

චන්ද්රරත්න විතානගේ
සාමාජික

ආචාර්ය ඩි.ඩි.ඩි. සුරවීර
සාමාජික

2020 මැයි 21 වන දින කොළඹදීය.

10.2 මූල්ය කාර්යසාධන ප්රකාශය

දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා	සටහන	2019 (රුපියල්)	2018 (රුපියල්)
මෙහෙයුම් ආදායම			
පුනරාවර්තන ප්රදානය		325,250,000	263,750,000
කාර්ය මණ්ඩල සංවර්ධන ප්රදානය		717,990	2,230,459
නිපුණතා අංශ සංවර්ධන ප්රදානය	20	21,461,960	47,869,094
අධ්යයන කටයුතුවලින් ආදායම	21	1,409,972	1,780,500
අඩුකළා - අධ්යයන කටයුතු මත සෘජු වියදම	22	276,841	243,092
අධ්යයන කටයුතුවලින් ශුද්ධ ආදායම		1,133,131	1,537,408
උපාධි වැඩසටහන්වලින් ආදායම	23	33,083,300	20,705,500
වෙනත් ආදායම්	24	10,544,923	14,056,288
විලම්බිත ආදායම ක්රමක්ෂය කිරීම	25	109,710,340	107,474,612
මුළු මෙහෙයුම් ආදායම		501,901,644	457,623,361
මෙහෙයුම් වියදම්			
සේවක පිරිවැය	26	280,765,429	204,845,184
ගමන් වියදම්	27	397,010	368,711
සැපයුම් හා අවශ්ය දේ	28	8,699,219	6,511,437
නඩත්තු වියදම්	29	6,934,987	6,482,658
සේවා	30	92,313,955	73,435,749
දෙපළ, පිරියත හා උපකරණ ක්ෂය කිරීම හා ක්රමක්ෂය	31	111,373,251	107,474,612
නිපුණාත අංශ සංවර්ධන වියදම්	32	21,461,960	47,869,094
ප්රතිපාදනයන්ට පෙර මුළු මෙහෙයුම් වියදම්/ස්ථාවර වත්කම් බැහැර කිරීමේ අලාභ		521,945,811	446,987,445
ප්රතිපාදනයන්ට පෙර ශුද්ධ මෙහෙයුම් අතිරික්තය/ (හිඟය)		(20,044,167)	10,635,916
පාරිතෝෂික ප්රතිපාදනය		4,947,925	-
වත්කම් බැහැරකිරීමේ පාඩුව		120,542	
වත්කම් පරිත්යාගකිරීමේ පාඩුව		-	3,042
ප්රතිපාදනයන්ට පසු ශුද්ධ අතිරික්තය/ (හිඟය)		(25,112,634)	10,632,874

පිටු අංක 06 සිට 10 දක්වා ගිණුම්කරණ ප්රතිපත්ති හා පිටු අංක 11 සිට 23 දක්වා ඇති සටහන් මේ මූල්ය ප්රකාශයන්හිම කොටසක් වේ.

10.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය සඳහා	2019 (රුපියල්)	2018 (රුපියල්)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහය වීම්		
සාමාන්‍ය ක්‍රියාකාරකම් වෙතින් අතිරික්තය/හිඟය	(25,112,634)	10,632,874
මුදල් නොවන සංචලනයන්		
විලම්බිත ආදායම/ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	(109,710,340)	(107,474,612)
ක්ෂය හා ක්‍රමක්ෂය	111,373,251	107,474,612
ස්ථාවර වත්කම් බැහැර කිරීමේදී ලාභය/අලාභය	120,542	
ස්ථාවර වත්කම් පරිත්‍යාග කිරීමේදී ලාභය/අලාභය	-	3,042
පාරිතෝෂිකය	4,947,925	(295,035)
විගණන ගාස්තු		
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	(18,381,256)	10,340,881
තොගවල (වැඩි)/අඩු වීම	(417,660)	284,543
කාර්ය මණ්ඩල ණයගැතියන්ගේ (වැඩි)/අඩු වීම	(294,231)	(190,984)
ණයගැතියන්ගේ හා අයවිය යුතු දේහි (වැඩි)/අඩු වීම	55,437,832	(23,418,039)
පෙර ගෙවීම්වල (වැඩි)/අඩු වීම	2,049,066	(2,384,517)
අත්තිකාරමේ (වැඩි)/අඩු වීම	1,307,148	(1,336,035)
අයවිය යුතු තැන්පතුවල (වැඩි)/අඩු වීම	294,000	111,815
කල් ඇතිව ලද අත්තිකාරම් (වැඩි)/අඩු වීම		
ආපසු ගෙවිය යුතු තැන්පතුවල (වැඩි)/(අඩු) වීම	665,485	7,396,700
ගෙවිය යුතු ගිණුම් වල (වැඩි/අඩු) වීම	(63,373,215)	60,936,735
පෙර වර්ෂය සම්බන්ධයෙන් ගැලපීම		
පාරිතෝෂික ගෙවීම	(2,075,215)	(581,826)
විගණන ගාස්තු ගෙවීම		
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල් ප්‍රවාහය වීම්	24,788,046	51,813,273
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහ		
ඉඩම්		
ගොඩනැගිලි	(8,704,027)	(55,495,195)
රථ වාහන	-	(6,325,000)
පරිගණක	(7,369,774)	(19,383,800)
ගෘහභාණ්ඩ හා වැද්දුම්	(995,774)	(4,175,509)
කාර්යාලීය උපකරණ	(355,900)	(1,913,750)
ඉගැන්වීමේ උපකරණ	(18,914,947)	(25,514,861)
පිරියත හා යන්ත්‍ර	(3,826,260)	(52,603,954)
ග්‍රන්ථ	(1,855,524)	(1,390,692)
වෙනත් වත්කම්	(766,876)	(414,050)
සිදු කෙරෙමින් ඇති කාර්යයන්	(17,307,651)	(54,474,973)
අස්පෘශ්‍ය වත්කම්	(1,725,191)	
ආයෝජනය	(9,183,322)	(12,217,836)
පුස්තකාල තැන්පතු	3,570,000	780,922
විද්‍යාගාර තැන්පතු	3,570,000	800,000
නේවාසිකාගාර තැන්පතු	97,000	664,000
වත්කම් බැහැර දීම්වලින් ලද ආදායම	122,740	
කල්බදු කුලිය	(1,198,814)	
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල් ප්‍රවාහය වීම්	(64,844,320)	(231,674,698)
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහය වීම්		
ප්‍රාග්ධන දායකත්වය - මහා භාණ්ඩාගාරය	77,282,010	129,611,541
ප්‍රාග්ධන ප්‍රදාන	11,802,245	44,237,822
සමුච්චිත අරමුදල	2,827,874	
වෙනත් අරමුදල්	17,100	18,900
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වෙතින් ශුද්ධ මුදල් ප්‍රවාහය වීම්	91,929,229	173,868,263
මුදල් හා මුදල් සමාන දේහි ශුද්ධ වැඩි/(අඩු) වීම	2,296,863	(6,647,162)
කාලපරිච්ඡේදය මුලදී මුදල් හා මුදල් සමාන දේ	8,142,762	14,789,924
කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා මුදල් සමාන දේ	10,439,625	8,142,762

පිටු අංක 06 සිට 10 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 11 සිට 23 දක්වා ඇති සටහන් මේ මූල්‍ය ප්‍රකාශයන්හිම කොටසක් වේ.

10.4 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් වෙනස් වීම් පිළිබඳ ප්‍රකාශය

	සමුච්චිත අරමුදල (රුපියල්)	ප්‍රත්‍යාගණන අතිරික්තය (රුපියල්)	වෙනත් අරමුදල් (රුපියල්)	ප්‍රාග්ධන ප්‍රධාන													මුළු ශුද්ධ වත්කම (රුපියල්)
				ටී.ඊ.ඩී.පී (රු.)	භාණ්ඩාගාර (රු.)	ජී.ඕ.පී.ඒ. (රු.)	වයි.ඒ.එස්.ඩී අමාත්‍යාංශය (රු.)	ඩී.ටී.ඊ.ටී (රු.)	නොරාඩ (රු.)	එස්,ඩී,පී (රු.)	ඩබ්.යූ.එස්.සී. (රු.)	එම්.ඕ.එ ෆ්. (රු.)	එස්.ඩී.ඩී. (රු.)	ජී.අයි. ඉසඩ	ඩයිකින්	විලම්බිත ආදායම (රු.)	
2018.01.01 දිනට ශේෂය	(12,365,315)	30,931,260	583,312	81,415,948	10,435,000	5,580	157,363,346	705,756,958	-	4,069,569	210,625	6,876	124,972,089	63,016		506,574,654	1,610,022,919
ගැලපීම්		(688,385)														688,385	
ක්‍රමක් ක්ෂය	(1,831,091)			(27,626,128)	(2,274,167)	(1,860)	(12,973,918)	(10,764,590)		(1,959,420)	(210,625)	-	(1,549,240)	(6,600)		(48,965,359)	(108,162,998)
එකතුකිරීම්			18,900										44,237,822				44,256,722
වසර සඳහා දායකත්වය																129,611,541	129,611,541
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (හිඟය)	10,632,874																10,632,874
2018.12.31 **දිනට ශේෂය**	(3,563,532)	30,242,875	602,212	53,789,820	8,160,833	3,720	144,389,428	694,992,368	-	2,110,149	-	6,876	167,660,671	56,416	-	587,909,221	1,686,361,059
2019.01.01 **දිනට ශේෂය**	(3563,532)	30,242,875	602,212	53,789,820	8,160,833	3,720	144,389,428	694,992,368	-	2,110,149	-	6,876	167,660,671	56,416	-	587,909,221	1,686,361,059
ගැලපීම්	3,106,895	(806,555)						498,054	112,689	575,665						1,349,732	4,836,480
ක්‍රමක් ක්ෂය				(16,964,986)	(2,274,167)	(1,860)	(12,066,465)	(10,006,143)	(62,858)	(1,096,708)			(1,372,134)	(6,600)	(140,158)	(65,718,262)	(109,710,341)
එකතුකිරීම්			17,100										10,102,658	-	1,699,588		11,819,345
වසර සඳහා දායකත්වය																77,282,010	77,282,010
කාලපරිච්ඡේදය සඳහා අතිරික්තය/ (හිඟය)	(25,112,634)																(25,112,634)
2019.12.31 දිනට ශේෂය	(25,569,271)	29,436,320	619,312	36,824,834	5,886,667	1,860	132,322,963	685,484,279	49,831	1,589,106	-	6,876	176,391,195	49,816	1,559,430	600,822,701	1,645,475,919

පිටු අංක 06 සිට 10 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති හා පිටු අංක 11 සිට 23 දක්වා ඇති සටහන් මේ මුල්‍ය ප්‍රකාශයන්හිම කොටසක් වේ.

10.5 වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය
අයවැය හා සත්ය මුදල සංසන්දනය කිරීමේ ප්‍රකාශය

රුපියල්

වර්ගය	මුල් අයවැය	සංශෝධිත අයවැය	සත්ය වියදම	වෙනස
රජයේ දායකත්වය	288,000,000	336,250,000	325,250,000	(11,000,000)
විශ්වවිද්‍යාලයිය ඉපයීම්	34,000,000	47,600,000	45,420,696	(2,179,304)
නිපුනතා ආංශික සංවර්ධන වැඩසටහන	172,500,000	154,100,000	108,326,030	(45,773,970)
මුළු ලැබීම	**494,500,000**	**537,950,000**	**478,996,726**	**(58,953,274)**
පුද්ගල පඩිනඩි	230,110,000	283,816,000	283,740,466	75,534
ගමන්	350,000	408,000	404,162	3,838
සැපයුම්	7,430,000	8,840,000	8,821,784	18,216
නඩත්තු	6,500,000	6,980,000	6,956,530	23,470
සේවා	76,610,000	83,056,000	83,011,681	44,319
වෙනත්	1,000,000	750,000	734,979	15,021
නිපුනතා ආංශික සංවර්ධන වැඩසටහන	172,500,000	154,100,000	108,326,030	45,773,970
මුළු වියදම	**494,500,000**	**537,950,000**	**491,995,632**	**45,954,368**
ශුද්ධ ලැබීම/ගෙවීම්			**(12,998,906)**	

10.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

10.5.1 වැදගත් මූල්‍ය ප්‍රතිපත්ති

10.5.2 පොදු ප්‍රතිපත්ති

10.5.3 වාර්තා කරන අධිකාරිය

වෘත්තීය තාක්ෂණවේද විශ්වවිද්‍යාලය (මින් මතු විශ්වවිද්‍යාලය වශයෙන් හැඳින්වෙන) 2008 අංක 31 දරන පාර්ලිමේන්තු පනත මගින් සංස්ථාගත කරන ලද අතර එය රත්මලාන, කඳවල, අංක 100 හි පිහිටා ඇත.

10.5.4 ප්‍රධාන ක්‍රියාකාරකම්

අ.) ප්‍රථම උපාධි වැඩසටහන් පැවැත්වීම
ආ) පශ්චාත් උපාධි වැඩසටහන් සංවර්ධනය කිරීම
ඇ) ටිවීඊටි අධ්‍යාපනය සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම
ඈ) ටිවීඊටි ආයතනයේ විෂයමාලා සංවර්ධනය කිරීම
ඉ) උපාධි විෂයමාලා සංවර්ධනය කිරීම
ඊ) ඉගෙනුම් ද්‍රව්‍ය සංවර්ධනය කිරීම
උ) වෘත්තීය සංවර්ධනය සඳහා කෙටි-කාලීන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම

10.5.5 සූදානම් කිරීමේ පදනම

අ) අනුගතවීම පිළිබඳ ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කර ඇත. අනාවරණය කර ඇති තැන්හිදී හැර, ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර කාලපරිච්ඡේදයෙහිදී භාවිතා කරන ලද ඒවාට අනුකූල වේ. මෙම මූල්‍ය ප්‍රකාශ අඛන්ඩ පැවැත්මක් ඇති යන පදනමින් පිළියෙළ කර ඇත්තේ ඉදිරි කාලපරිච්ඡේදය (2019) තුළ මෙම ආයතනය ඈවර කිරීමේ අදහසක් නොමැති බැවිනි.

ආ) මැනීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය පදනමින් පිළියෙළ කර ඇති අතර, ප්‍රකාශ කර ඇති තැන්හිදී හැර වටිනාකම්වල අගය වෙනස්වීම් සඳහා ගැලපීම් නොකෙරේ.

ඇ) ක්‍රියාකාරිත්ව හා ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

මූල්‍ය ප්‍රකාශයන් මෙම විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරිත්ව හා ඉදිරිපත් කිරීම් මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරේ.

වෙනත් ලෙස ප්‍රකාශ කෙරේ නම් හැර, ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති සියලුම මූල්‍ය දත්ත ආසන්නතම රුපියලට වටයා ඇත.

10.5.6 තුලනාත්මක තොරතුරු

වත්මන් කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අවබෝධය වර්ධනය කරනු පිණිස පෙර කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් තුලනාත්මක තොරතුරු අනාවරණය කෙරේ.

මූල්‍ය ප්‍රකාශයන්හි අයිතමයන් වර්ගීකරණය කිරීම හෝ ඉදිරිපත් කිරීම සංශෝධනය කෙරෙන අවස්ථාවන්හිදී, වඩා යහපත් ඉදිරිපත් කිරීමක් සපයනු පිණිස, සන්සන්දනාත්මක සංඛ්‍යාවන්ද වත්මන් වර්ෂයට අනුකූල වන ලෙස යළි වර්ගීකරණය කර ඇත.

10.6 වත්කම් හා ඒවායේ තක්සේරු පදනම

10.6.1 දේපළ පිරියත හා උපකරණ

අ. ප්‍රතිග්‍රහණය හා මැනීම

2009 ඔක්තෝබර් 12 දිනට පසුව අත්කර ගනු ලැබූ දේපළ, පිරියත හා උපකරණ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ අගයට සඳහන් කරනු ලැබේ.

ආ) පිරිවැය

දේපළ, පිරියත හා උපකරණවල පිරිවැය එහි ගැනුම් මිලෙන් හා එම වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජනය ගැනීම සඳහා ක්‍රියාකරන තත්ත්වයට ගෙන ඒමේදී වැය වූ කවර හෝ වියදම්වලින් සමන්විත වේ. ස්ථීර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, ව්‍යාප්ත කිරීම හා දියුණු කිරීම සඳහා පසුව වැය වූ වියදම ප්‍රාග්ධන වියදම වශයෙන් සලකා ඇත

ඇ) ක්ෂය

දේපළ, පිරියත හා උපකරණවල ක්ෂය සඳහා ප්‍රතිපාදනය ගණනය කරනු ලබන්නේ ඒවායේ ප්‍රයෝජනවත් ආයුකාලය මුළුල්ලේ පහත අනුපාතිකවලින් පිරිවැය මත හෝ තක්සේරුව මත සරල රේඛීය ක්‍රමය භාවිතා කරමිනි.

- ගොඩනැගිලි 5%
- මායිම් තාප්ප 5%
- වතුර මල 5%
- මෝටර් වාහන 25%
- පරිගණක 16.66%
- ගෘහ භාණ්ඩ හා වැද්දුම් 10%
- කාර්යාලීය උපකරණ 10%
- පිරියත හා යන්ත්‍ර සූත්‍ර 10%
- ඉගෙනුම් උපකරණ 10%
- පොත් 10%
- වෙනත් වත්කම් 16.66%

2013.12.31 දක්වා අත්කර ගත් වර්ෂය සඳහා මුළු වර්ෂය වෙනුවෙන්ම ක්ෂය ප්‍රතිපාදනය කරන අතර, වත්කම් බැහැර කරන වර්ෂය සඳහා කිසිදු ක්ෂය ප්‍රතිපාදනයක් නොකෙරේ. 2013 සිට ඉදිරියට, වත්කම් ක්ෂය වීම එය භාවිතයට ඇති අවස්ථාවේදී ඇරඹෙන අතර, එය විකිණීම/බැහැර කිරීම සඳහා දරනු ලබන ලෙස වර්ගීකරණය කරන දිනයේදී අවසන් වෙයි.

1996 වර්ෂයේ මිලට ගත් මගී බස් රථය (අශෝක් ලේලන්ඩ් - ආසන 42) භාවිතයට ගත නොහැකි බවින් 2016.12.31 දිනට පිරිවැය නොගෙන ඇත.විශ්ව විද්‍යාලය සඳහා සකස් කරන ලද ආයතන සංග්‍රහයේ පිරිවැය වෙනත් වත්කම් යටතේ හඳුනාගෙන ඇති අතර එය ක්‍රියාවට නැංවීම සඳහා හැකි වන විට ක්ෂය කපා හැරේ.

10.6.2 වත්කම් ඇගයුම

අ. ප්‍රත්‍යාගණනය කරන ලද දේපළ, පිරියත හා උපකරණ එම ප්‍රත්‍යාගණනය කරන ලද අගයෙන් සමුච්චිත ක්ෂය අඩු කොට සඳහන් කරනු ලැබීය

ආ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ආයුකාලය ඒ සඳහා පත් කරන ලද කමිටුව විසින් තීරණය කරන ලද පරිදි පහත සඳහන් වේ

ගෘහ භාණ්ඩ හා වැද්දුම් අවුරුදු 08
ඉගැන්වීමේ උපකරණ අවුරුදු 10
ගොඩනැගිලිවල ආයුකාලය අවුරුදු 20 ක් ලෙස සලකන ලදී..

2014.12.31 දිනට ශූන්‍ය ගෙන යන වටිණාකමක් තිබූ අදාළ දේපළ, පිරියත හා උපකරණවලට ඉතිරි ප්‍රයෝජනවත් ආයුකාලය පත් කරන ලද කමිටුවක් විසින් නිර්ණය කරන ලදුව ඒ අනුව ක්ෂය කරන ලදී.

2014 සිට ආයුකාලය

පරිගණක (තක්සේරු කරන ලද)	වර්ෂ 2 මා. 9.5
කාර්යාලීය උපකරණ (තක්සේරු කරන ලද)	වර්ෂ 2 මා.9.5
පරිගණක (විශ්වවිද්‍යාල අරමුදල් සම්පාදිත)	වර්ෂ 2 මා.9
වෙනත් වත්කම් (විශ්වවිද්‍යාල අරමුදල් සම්පාදිත)	වර්ෂ 2 මා. 9

2015.12.31 දිනට භාවිතයට ගතහැකි වටිනාකමක් ඇති වත්කම්, පිරියත හා උපකරණවල ඉතිරි ආයු කාලය තීරණය කරනු ලැබුවේ පත් කරන ලද කමිටුවක් මගිනි.

වාහන (වි. වි. අරමුදල් සම්පාදිත)	මිලදී ගැනීමෙන් වසර 12ක්
වාහන (තක්සේරු කරන ලද)	මිලදී ගැනීමෙන් වසර 12ක්
පරිගණක (වි. වි. අරමුදල් සම්පාදිත)	මිලදී ගැනීමෙන් වසර 06ක්
පුස්තකාල පොත් (වි.වි. අරමුදල් සම්පාදිත)	මිලදී ගැනීමෙන් වසර 06ක්
වෙනත් වත්කම් (වි. වි. අරමුදල් සම්පාදිත)	මිලදී ගැනීමෙන් වසර 06ක්

2016.12.31 දිනට භාවිතයට ගතහැකි වටිනාකමක් ඇති වත්කම්, පිරියත හා උපකරණවල ඉතිරි ආයු කාලය තීරණය කරනු ලැබුවේ පත් කරන ලද කමිටුවක් මගිනි.

පරිගණක (විශ්වවිද්‍යාල අරමුදල් සම්පාදිත) 2016 සිට වසර 2ක්

පුස්තකාල පොත් (වි.වි. අරමුදල් සම්පාදිත) 2016 සිට වසර 5ක්

2017.12.31 දිනට භාවිතයට ගතහැකි වටිනාකමක් ඇති වත්කම්, පිරියත හා උපකරණවල ඉතිරි ආයු කාලය තීරණය කරනු ලැබුවේ පත් කරන ලද කමිටුවක් මගිනි.

වෙනත් වත්කම් (වි. වි. අරමුදල් සම්පාදිත)	2017 සිට වසර 3ක්
පුස්තකාල පොත් (වි.වි. අරමුදල් සම්පාදිත)	
2012 වර්ෂයේ මිලදී ගැනීම්	2017 සිට වසර 4ක්
2014 වර්ෂයේ මිලදී ගැනීම්	2017 සිට වසර 7ක්

2018.12.31 දිනට භාවිතයට ගතහැකි වටිනාකමක් ඇති වත්කම්, පිරියත හා උපකරණවල ඉතිරි ආයු කාලය තීරණය කරනු ලැබුවේ පත් කරන ලද කමිටුවක් මගිනි.

පරිගණක	2014 වර්ෂයේ මිලදීගත් පරිගණක 2018 වර්ෂයේ සිට වසර 2ක්, 2011 සහ 2013 වසරේ මිලදීගත් පරිගණක වෙන්දේසි කිරීමට
වෙනත් වත්කම්	2011 වසරේ මිලදිගත් වත්කම් 2018 සිට වසර 2ක්

2013 වසරේ මිලදීගත් වත්කම් 2018 සිට වසර 4ක්

පොත් 2015 වසරේ මිලදීගත් ග්‍රන්ථ වසර 7ක්

2013 වසරේ මිලදීගත් ග්‍රන්ථ වසර 4ක්

10.6.3 පරිලේඛන

පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිණාකම යන දෙකෙන් පහත අගය මත පරිලේඛන සඳහන් කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි වටිණාකම යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී ඇස්තමේන්තුගත විකිණුම් මිලෙන් සම්පූර්ණ කිරීමේ හා විකිණීමේ වියදම් අඩු කළ විට අගයයි.

10.7 විශ්‍රාම පාරිතෝෂික සැපයුම

විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතුව සිට ඇති සියලුම සේවකයින් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු වන විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන සලස්වා ඇත. සේවකයකු වෙත මෙම බැරකම පැන නගිනුයේ වර්ෂ 5 ක අඛණ්ඩ සේවාකාලයක් සම්පූර්ණ කළ විට පමණකි.මුළු වගකීම් සත්‍යවශයෙන්ම අගය කරනු ලබන අතර ඒ සඳහා පරිබාහිරව අරමුදල් සපයනු නොලබයි.

10.8 රජයේ ප්‍රදානයන් හා සහනාධාර

ඇති වූ වියදම් සඳහා විශ්වවිද්‍යාලයට හානිපූරණය කරන රජයේ ප්‍රදානයන් ඒවා ලැබුණු අවස්ථාවේදී හඳුනා ගනු ලැබේ. පුනරාවර්තන ස්වභාවයේ ප්‍රදානයන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ ආදායම් ලෙස හඳුනාගනු ලබන අතර ප්‍රාග්ධන ස්වභාවයේ ප්‍රදානයන් විලම්බිත ආදායම වශයෙන් බැර කොට, අදාළ වත්කමේ ප්‍රයෝජනවත් ආයුකාලය මුළුල්ලේ ස්ථාවර පදනමින් වාර්ෂිකව ක්‍රමක්ෂය කෙරේ

10.9 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

10.9.1 ආදායම් හඳුනාගැනීම

අ. පුනරාවර්තන ප්‍රදාය වෙතින් වූ ආදායම ලැබුණු විට හඳුනා ගැනේ.
ආ. පාඨමාලා හා ඩිප්ලෝමා ගාස්තු ලැබුණු විට හඳුනා ගැනේ.
ඇ. විශේෂඥ-උපදේශක ආදායම අදාළ ක්‍රියාකාරකම සම්පූර්ණ කළ විට හඳුනා ගනු ලැබේ.
ඈ. වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

10.9.2 වියදම්

විශ්වවිද්‍යාලයේ එදිනෙදා මෙහෙයුම්වලදී හා දේපළ, පිරියත හා උපකරණ නඩත්තුව කාර්යක්ෂම තත්ත්වයක පවත්වා ගැනීම උදෙසා ඇති වන සියලු වියදම් වර්ෂය සඳහා වූ අතිරික්තය/ හිඟය ගණනය කිරීමෙහිලා ආදායම් ප්‍රකාශයට ආදේශ කර ඇත.

10.10 මූල්‍ය සංසරණ ප්‍රකාශය

මූල්‍ය සංසරණ ප්‍රකාශය පිළියෙළ කර ඇත්තේ ''චක්‍ර ක්‍රමය'' භාවිතා කරමිනි. මූල්‍ය හා මූල්‍ය පර්යායයන් විශ්වවිද්‍යාලයේ බැංකු ගිණුම්වල ශේෂයන්ගෙන් සමන්විත වෙයි.

10.11 අනාවරණයන්

ශේෂ පත්‍රයේ දිනට පසුව සිදුවීම්

ශේෂ පත්‍රයේ දිනට පසුව මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය වන කිසිදු සිදුවීමක් සිදු නොවීය.

10.6 මූල්ය ප්රකාශයන්ට සටහන්

	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2019 (රුපියල්)	2018 (රුපියල්)
2	**බැංකුවල ශේෂ**		
	ලංකා බැංකුව - රත්මලාන ගිණුම් අංක 0070308457	6,192,348	1,247,317
	මහජන බැංකුව - රත්මලාන ගිණුම් අංක 080-1-001-3-0003120	3,031,499	5,679,667
	7 දින කැඳවුම් තැන්පතු - මහජන බැංකුව - රත්මලාන	1,215,778	1,215,778
		10,439,625	8,142,762
3	**අත්තිකාරම් හා අයවිය යුතු තැන්පතු**		
	අත්තිකාරම්		
	විවිධ අත්තිකාරම්	98,352	1,405,500
		98,352	1,405,500
	අයවිය යුතු තැන්පතු		
	බන්ඩාරනායක ජාත්යන්තර සම්මන්ත්රණ ශාලාව		250,000
	විවෘත විශ්වවිද්යාලය		-
	ශ්රී ලංකා ගමනාගමන මණ්ඩලය	117,420	131,420
	පුස්තකාල තැන්පතුව - කොළඹ විශ්වවිද්යාලය	5,000	5,000
	ජයවර්ධනපුර විශ්වවිද්යාලය	-	30,000
		122,420	416,420
		220,772	1,821,920
4	**පෙර ගෙවීම්**		
	රක්ෂණ හා ලියාපදිංචි ගාස්තු	424,675	350,655
	යන්ත්ර පිරියත හා උපකරණ - වෙනත්	-	33,447
	උපාධි ප්රදානෝත්සව	-	846,162
	මෘදුකාංග යාවත්කාලීන කිරීම	-	941,905
	විදේශ ගමන් -අනියම්		
	නඩත්තුව - ඡායාපිටපත් යන්ත්ර/ වායුසමන යන්ත්ර හා විදුලි සෝපානය	1,245,465	1,549,113
	පුවත්පත් හා වාරසඟරා	47,232	45,156
	සාමාජිකත්වය		
		1,717,372	3,766,438
5	**කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්**		
	ආපදා ණය	6,258,675	5,971,944
	උත්සව අත්තිකාරම්	8,750	1,250
	විශේෂ අත්තිකාරම්		-
		6,267,425	5,973,194
6	**ණයගැතියෝ හා අයවිය යුතු දේ**		
	විවිධ ආදායම්		107,577
	උපාධි ප්රදානෝත්සවය		-
	ආදායම - විශේෂඥ උපදේශකත්ව, පුහුණු හා විෂයමාලා සේවා		
	දේපළවල කුලිය - නේවාසිකාගාර	339,300	268,500
	ස්ථිර තැන්පතුවේ පොළිය	1,857,398	1,103,923
	කැඳවුම් තැන්පතුවේ පොළිය	359,904	299,115
	ශිෂ්ය සුභසාධනය	358,891	358,891
	පී.එම්.යූ.එස්. මුදලිගේ	3,400	3,400
	පී.ඒ.කේ. ගණනාත්	7,000	7,000
	සී . ජේ අබේවික්රම	186,374	-
	නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන්	10,216,442	63,773,813
	අධ්යාපන අමාත්යාංශය		1,585,000
	විශ්වවිද්යාලය - සේවක		-
	විශ්වවිද්යාලා විද්යාතන		1,259,322
		13,328,709	68,766,541
7	**ආයෝජන (ආපසු ගෙවිය යුතු ශිෂ්ය තැන්පතු)**		
	මහජන බැංකුව - රත්මලාන	36,451,355	27,794,100
	ලංකා බැංකුව - රත්මලාන	17,058,544	16,532,477
		53,509,899	44,326,577

මූල්ය ප්රකාශයන්ට සටහන්

දේපළ, පිරියත හා උපකරණ

	2019.01.01 දිනට ශේෂය	ගැලපීම	එකතු කිරීම	බැහැර කිරීම්	2019.12.31 දිනට ශේෂය
	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්
8.1 **පුනරුත්ථාපනය හා දියුණු කිරීම්**					
ඉඩම්	4,633,190				4,633,190
ගොඩනැගිලි	162,841,731		8,704,027		171,545,758
ප්රධාන ගොඩනැගිල්ල	17,601,164				17,601,164
මෝටර් වාහන	569,931				569,931
පරිගණක	16,500				16,500
ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	5,386,336				5,386,336
පිරියත හා යන්ත්රෝපකරණ	157,052				157,052
මායිම් තාප්ප	874,486				874,486
ග්රන්ථ	225,000				225,000
වෙනත් වත්කම්	432,035				432,035
8.2 **ස්ථාවර වත්කම් අත්කර ගැනීම**					
ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම	609,880,843				609,880,843
ගොඩනැගිලි	558,103,932				558,103,932
යූනිවෝටෙක් වතුර මල	11,190,627				11,190,627
මෝටර් වාහන	45,075,000				45,075,000
කල්බදු වාහන			11,957,650		11,957,650
පරිගණක	90,271,768		1,588,925	(1,511,600)	90,349,093
ගෘහභාණ්ඩ හා වැද්දුම්	71,110,678		995,774		72,106,452
කාර්යාලීය උපකරණ	55,359,573		355,900	(2,411,500)	53,303,973
ඉගැන්වීමේ උපකරණ	325,939,043		18,914,948	(818,496)	344,035,495
පිරියත හා යන්ත්රෝපකරණ	130,981,883		3,826,260	(2,640,000)	132,168,143
ග්රන්ථ	38,378,772		1,855,524		40,234,296
වෙනත් වත්කම්	16,236,427		766,876	(40,459)	16,962,844
අනු එකතුව	2,145,265,971		48,965,884	(7,422,055)	2,186,809,800

දේපළ, පිරියත හා උපකරණ - එස්.එස්.ඩී.

	2019.01.01 දිනට ශේෂය	ගැලපීම	එකතු කිරීම	බැහැර කිරීම්	2019.12.31 දිනට ශේෂය
	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්
8.1 අ . **පුනරුත්ථාපනය හා දියුණු කිරීම්**					
ගොඩනැගිලි	6,992,138				6,992,138
8.2 අ. **ස්ථාවර වත්කම් අත්කර ගැනීම**					
ගෘහභාණ්ඩ හා වැද්දුම්	537,342				537,342
කාර්යාලීය උපකරණ	1,322,720				1,322,720
ඉගැන්වීමේ උපකරණ	2,425,999				2,425,999
පිරියත හා යන්ත්රෝපකරණ	5,496,450				5,496,450
පරිගණක			5,780,849		5,780,849
වෙනත් වත්කම්	2,002,336				2,002,336
අනු එකතුව	18,776,985		5,780,849		24,557,834
එකතුව	2,164,042,956		54,746,733	(7,422,055)	2,211,367,634

මූල්ය ප්රකාශයන්ට සටහන්

ක්ෂය	2019.01.01 දිනට ශේෂය	ගැලපීම	කාලච්ඡේදය සඳහා එකතු කිරීම	බැහැර කිරීම්	2019.12.31 දිනට ශේෂය
	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්
8.3 **පුනරුත්ථාපනය හා දියුණු කිරීම්**					
ගොඩනැගිලි	20,887,870		8,253,856		29,141,725
ප්රධාන ගොඩනැගිල්ල	4,063,575		880,058		4,943,633
මෝටර් වාහන	569,931				569,931
පරිගණක	16,500				16,500
ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	1,344,890		538,634		1,883,523
පිරියත හා යන්ත්රෝපකරණ	106,409		15,705		122,114
මායිම් තාප්ප	524,691		43,724		568,416
ග්රන්ථ	225,000				225,000
වෙනත් වත්කම්	432,035		52,892		484,927
8.4 **ස්ථාවර වත්කම් අත්කර ගැනීම**					
ගොඩනැගිලි	234,801,280	688,385	27,438,137		262,927,802
යූනිවෝල්ටෙක් වතුර මල	5,035,782		559,531		5,595,314
මෝටර් වාහන	26,524,833	(93,681)	4,780,447		31,211,598
කල්බදු වාහන			1,539,752		1,539,752
පරිගණක	47,972,107		12,742,449	(1,479,900)	59,234,656
ගෘහභාණ්ඩ හා වැද්දුම්	43,645,680	(1,136,134)	4,841,734		47,351,280
කාර්යාලීය උපකරණ	45,113,350	(501,843)	3,248,273	(2,258,350)	45,601,430
ඉගැන්වීමේ උපකරණ	219,558,294		25,577,979	(760,877)	244,375,396
පිරියත හා යන්ත්රෝපකරණ	33,607,060		15,001,474	(2,640,000)	45,968,534
ග්රන්ථ	29,078,098		1,499,792		30,577,890
වෙනත් වත්කම්	13,644,031	(965,334)	1,471,792	(39,646)	14,110,843
අනු එකතුව	727,151,415	(2,008,607)	108,486,229	(7,178,773)	826,450,264

ක්ෂය - එස්.එස්.ඩී.

	2019.01.01 දිනට ශේෂය	ගැලපීම	කාලච්ඡේදය සඳහා එකතු කිරීම	බැහැර කිරීම්	2019.12.31 දිනට ශේෂය
	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්
8.3 අ. **පුනරුත්ථාපනය හා දියුණු කිරීම්**					
ගොඩනැගිලි	1,404,373		349,607		1,753,980
8.4 අ. **ස්ථාවර වත්කම් අත්කර ගැනීම**					
ගෘහභාණ්ඩ හා වැද්දුම්	214,937		53,734		268,671
කාර්යාලීය උපකරණ	529,088		132,272		661,360
ඉගැන්වීමේ උපකරණ	976,734		342,600		1,219,333
පිරියත හා යන්ත්රෝපකරණ	1,375,614		549,645		1,925,259
වෙනත් වත්කම්	1,780,954		44,276		1,825,231
අනු එකතුව	6,281,700		1,372,134		7,653,834
මුළු ක්ෂය	733,433,115	(2,008,607)	109,858,363	(7,178,773)	834,104,098
මුළු ශුද්ධ අගය	1,430,609,841				1,377,263,536

මූල්ය ප්රකාශවලට සටහන්

	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2019 (රුපියල්)	2018 (රුපියල්)
9	**නොනිමි වැඩ**	332,425,919	315,118,269
	නොනිමි වැඩ - ප්රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම		
	ගොඩනැගිලි	238,842,027	238,842,028
	මෘදුකාංග සංවර්ධන	1,320,000	378,000
	උපකරණ	65,661,090	65,661,090
	ශිෂ්ය නේවාසිකාගාරය	23,600,993	10,237,151
		329,424,110	315,118,269
	නොනිමි වැඩ - ප්රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා දියුණු කිරීම්		
	සිරිසි ගොඩනැගිල්ල - අයි.ටී.ඩී	3,001,809	
		3,001,809	

10 අස්පෘශ්ය වත්කම්

		2019.01.01 දිනට ශේෂය	ගැලපීම්	එකතුකිරීම්	බැහැරකිරීම්	2019.12.31 දිනට ශේෂය (රුපියල්)
10.1	**පුනරුත්ථාපනය හා දියුණු කිරීම්**					
	පරිගණක මෘදුකාංග	3,400,000				3,400,000
10.2	අත්පත්කරගැනීම්					
	ඊඑල්ටී මුදුකාංග	1,525,000				1,525,000
	වීඩියෝ මෘදුකාංග	525,000				525,000
	පරිගණක මෘදුකාංග			1,347,191		1,347,191
	පුස්ථකාල මෘදුකාංග			378,000		378,000
	එකතුව	5,450,000		1,725,191		7,175,191

ක්රමක්ෂය

		2019.01.01 දිනට ශේෂය	ගැලපීම්	කාලපරිච්ඡේදයට අදාළ ක්රමක්ෂය	කාලපරිච්ඡේදයට අදාළ ක්රමක්ෂය	2019.12.31 දිනට ශේෂය (රුපියල්)
10.3	**පුනරුත්ථාපනය හා දියුණු කිරීම්**					
	පරිගණක මෘදුකාංග	2,266,666		1,133,333		3,400,000
10.4	අත්පත්කරගැනීම්					
	ඊඑල්ටී මුදුකාංග	1,275,000		250,000		1,525,000
	වීඩියෝ මෘදුකාංග	525,000				525,000
	පරිගණක මෘදුකාංග			78,740		78,740
	පුස්ථකාල මෘදුකාංග			52,816		52,816
	මුළු ක්රමක් ක්ෂය	4,066,666		1,514,889		5,581,556
	මුළු ශුද්ධ එකතුව	1,383,334				1,593,635

මූල්ය ප්රකාශවලට සටහන්

	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2019 (රුපියල්)	2018 (රුපියල්)
11	**ගෙවිය යුතු ගිණුම් සහ වෙනත් වගකීම්**	61,977,436	125,350,651
	උපචිත වියදම්		
	වැටුප් හා වේතන	1,007,872	813,028
	අධ්යන දීමනා		185,839
	පර්යේෂණ දීමනා		27,904
	අතිරේක දීමනා		15,945
	ජීවන වියදම් දීමනාව	39,000	24,910
	ඉන්ධන දීමනා (සංසද වාහන)	79,450	75,060

	ඉන්ධන දීමනා (අධ්‍යක්ෂ ජනරාල්)	-	10,984
	අතිකාල	514,103	463,296
	නිවාඩු වෙනුවෙන් වැටුප්	43,517	27,009
	වෙනත් දීමනා - වෙනත්	33,500	132,075
	ගැලපුම් දීමනා	-	8,124
	ගමන් වියදම	3,429	10,581
	දුරකථනය	183,286	145,850
	අන්තර්ජාල සේවාව	1,005,157	522,606
	විදුලිය	1,055,432	348,716
	නඩත්තු - කේ.එච් 6725 වාහනය	3,360	650
	නඩත්තු - කේ.ආර් 1801 වාහනය	28,658	
	නඩත්තු - 301-1501 වාහනය	12,550	
	නඩත්තු - කාර්ය මණ්ඩල නිල නිවාස		527,348
	නඩත්තු - ගුරු උපකරණ		117,535
	නඩත්තු - ජායා පිටපත් යන්ත්ර, වායුසමීකරණ සහ විදුලි සෝපානය	192,865	6,854
	නේවාසිකාගාරය		2,120
	පර්යේෂණ	72,135	22,000
	ජලය	144,249	44,931
	පුවත්පත් හා වාරසඟරා	23,930	23,850
	ආරක්ෂක සේවා	1,003,321	759,875
	සහභාගිකයින් සඳහා ආහාර	22,930	13,920
	සනීපාරක්ෂක සේවා	702,592	618,165
	වාහන කුලියට ගැනීම්	1,888	
	උපදේශන පුහුණු - වෙනත්		213,350
	විගණන ගාස්තු	610,903	
	ධාරිතා සංවර්ධන -ඩිබි		506,878
	සාමාජිකත්වය		724
	මූල්‍ය ගාස්තු		250
	උපාධි ප්‍රදානෝත්සව / සමාරම්භක උත්සව	132,200	
	සිදුකරමින් පවතින වැඩ - ඩිබි		41,807,100
	විෂයමාලා සංවර්ධන - ඩිබි	111,370	221,150
	ඇගයුම්කරුවන් පුහුණුව - ඩිබි	422,100	13,500
	පශ්චාත් උපාධි සුදුසුකම් -ඩිබි		3,616,000
	කාර්මික පුහුණු කළමනාකරණය - ඩිබි		45,000
	සමාජීය අලෙවිකරණය - ඩිබි		2,827,120
	ගුරු පුහුණු වැඩසටහන - බාහිර -ඩිබි	56,000	
	ගුරු පුහුණු වැඩසටහන - අභ්‍යන්තර -ඩිබි	283,200	
	පුහුණු මධ්‍යස්ථාන කළමනාකරණය - ඩිබි	46,954	
	ගුණත්ව සහතික -ඩිබි	68,700	
	සමාජ අලෙවිකරණය		80,164
	ටීවීඊටි පුහුණුකරුවන් සඳහා එන්.වී.ක්වූ 5 -ඩිබි	445,460	
	බී.ටෙක් - මෘදුකාංග තාක්ෂණවේදය - අර්ධ කාලීන	229,205	118,023
	බී.ටෙක් - මෘදුකාංග තාක්ෂණවේදය - පූර්ණ කාලීන	118,453	63,075
	බී.ටෙක්. - ජාල තාක්ෂණවේදය		
	බී.ටෙක්. - ජාල තාක්ෂණවේදය - අර්ධ කාලීන	49,330	126,575
	බී.ටෙක්. - ජාල තාක්ෂණවේදය - පූර්ණ කාලීන	46,064	115,481
	බී.ටෙක්. - ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය - අර්ධ කාලීන	376,355	220,325
	බී.ටෙක්. - ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය - පූර්ණ කාලීන	166,480	132,600
	බී.ටෙක්. - විද්‍යුත් යාන්ත්‍රික තාක්ෂණවේදය - අර්ධ කාලීන	170,192	61,745
	බී.ටෙක්. - විද්‍යුත් යාන්ත්‍රික තාක්ෂණවේදය - පූර්ණ කාලීන	353,644	60,515
	බී.ටෙක්. - බහුමාධ්‍යක තාක්ෂණවේදය - අර්ධ කාලීන	210,906	79,701
	බී.ටෙක්. - බහුමාධ්‍යක තාක්ෂණවේදය - පූර්ණ කාලීන	186,692	81,400
	බී.ටෙක්. - චිත්‍රපට හා රූපවාහිනී අධ්‍යයනය - අර්ධ කාලීන		40,768
	බී.ටෙක්. - චිත්‍රපට හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණ -පූර්ණ කාලීන	2,520	
	බී.ටෙක්. - කර්මාන්ත කළමනාකරණය - අර්ධ කාලීන	102,675	15,920
	බී.ටෙක්. - කර්මාන්ත කළමනාකරණය - පූර්ණ කාලීන	40,520	110,058
	බී.ටෙක්. - ඉදිකිරීම් තාක්ෂණවේදය සහ සම්පත් කළමනාකරණය - පූර්ණ කාලීන	119,750	47,189
	බී.ටෙක්. - ඉදිකිරීම් තාක්ෂණවේදය - අර්ධ කාලීන	365,545	139,405
	බී.ටෙක් - ඉංග්‍රීසි භාෂාව පුහුණු කිරීම් තාක්ෂණවේදය - පූර්ණ කාලීන	4,500	4,575
	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2019 (රුපියල්)	2018 (රුපියල්)

	බී.ටෙක් - ඉංග්රීසි භාෂාව පුහුණු කිරීම් තාක්ෂණවේදය - අර්ධ කාලීන	157,820	37,250
	බී.ටෙක්. - ප්රමාණ සමීක්ෂණ -පූර්ණ කාලීන	5,570	6,150
	බී.ටෙක්. - ප්රමාණ සමීක්ෂණ - අර්ධ කාලීන	432,750	99,775
	බී.ටෙක්. - නිෂ්පාදන තාක්ෂණවේදය - අර්ධ කාලීන	249,282	72,300
	බී.ටෙක්. - නිෂ්පාදන තාක්ෂණවේදය - පූර්ණ කාලීන	237,852	70,930
	බී.ටෙක්. - ආහාර තාක්ෂණවේදය - පූර්ණ කාලීන	489,105	100,195
	බී.ටෙක්. - ආහාර තාක්ෂණවේදය - අර්ධ කාලීන	51,490	82,950
	බී.ටෙක් - හෝටල් කළමනාකරණය - පූර්ණ කාලීන	117,750	
	බී.ටෙක්. - බහුමාධ්ය තාක්ෂණවේදය	114,000	
	බී.ටෙක්. - චිත්රපට හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණ -පූර්ණ කාලීන	15,526	
	බී.ටෙක්. - චිත්රපට හා රූපවාහිනී නිෂ්පාදන තාක්ෂණ - අර්ධ කාලීන	21,039	
		12,845,126	56,167,316
	ගෘහභාණ්ඩ හා වැද්දුම්	463,636	1,965,742
	ඉගැන්වීමේ උපකරණ	3,508,519	7,380,270
	ග්රන්ථ	598,561	30,000
	වෙනත් වත්කම්		115,500
	ගොඩනැගිලි - පුනරුත්ථාපන	2,975,773	361,584
	පරිගණක	1,354,500	
	යන්ත්ර හා පිරියත		37,260,696
	පරිගණක - ඩිබි	5,780,849	
	අශ්පෘශ්ය වත්කම්	549,030	
	නොනිමි වැඩ	13,363,842	
	නොනිමි වැඩ - ඩිබි	3,001,809	
	අතැති තොග	909,080	360,500
	ලැබියයුතු ණයගැති - විශ්වවිද්යාලා විද්යාතන		1,247,101
	කලින් ලද අත්තිකාරම්		1,247,101
	ප්රචාරණය (දැන්වීම්)	134,385	
	විවිධ	930	116,000
		32,640,914	50,084,494
		45,486,040	106,251,810
	වෙනත් වගකීම්		
	වැටුප්	201,825	
	ගෙවීම්ලාභී බද්ද (ආදායක බද්ද)	637,755	282,720
	රදවා ගැනීම් බද්ධ	129,533	53,698
	කල්තියා ලද අත්තිකාරම්		(238,101)
	රදවා ගැනීම්	13,798,845	17,504,991
	විගණන ගාස්තු සඳහා ප්රතිපාදනය	300,000	249,654
	ශිෂ්ය සුභසාධන	1,423,438	1,245,879
		16,491,396	19,098,841
12	**ආපසු ගෙවිය යුතු කෙටි කාලීන තැන්පතු**		
	ටෙන්ඩර් තැන්පතු	1,500,160	1,952,675
	පුස්තකාල තැන්පතු	4,034,000	3,494,000
	විද්යාගාර තැන්පතු	4,030,000	3,490,000
	නේවාසිකාගාර තැන්පතු	100,000	62,000
		9,664,160	8,998,675
13	ලිසිං වගකීම්		
	වාහන අංකය සි.බී.එච්. 3320		
	කල් බදු දෙන්නා : ලංකා බැංකුව		
	කල්බදු ගිවිසුම් අංකය : 68100201900274700		
	වාහන වර්ගය : හොන්ඩා සිආර්වී		
	2020 සඳහා ගෙවිය යුතු වාරික	3,152,868	
	පොළී අවලම්භණය		
	2020 **සඳහා ගෙවිය යුතු පොලිය**	(1,189,633)	
		1,963,235	
14	**පාරිතෝෂිකය සඳහා ප්රතිපාදනය**		
	2019.01.01 දිනට ශේෂය	34,207,027	35,083,888
	2019 වර්ෂය සඳහා ප්රතිපාදනය	4,947,925	
	පාරිතෝෂික ගෙවීම්	(2,075,215)	(581,826)

	ගැලපුම්				(295,035)
	2019.12.31 දිනට ශේෂය			37,079,737	34,207,027
15	**ආපසු ගෙවිය යුතු දිගු කාලීන තැන්පතු**				
	පුස්තකාල තැන්පතු			17,885,000	14,315,000
	විද්‍යාගාර තැන්පතු			17,875,000	14,305,000
	නේවාසිකාගාර තැන්පතු			751,000	654,000
				36,511,000	29,274,000
	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා			2019 (රුපියල්)	2018 (රුපියල්)
16	**කල්බදු වගකීම්**				
	වාහන අංකය : සිබීඑච් 3320				
	කල්බදු දෙන්නා : ලංකා බැංකුව				
	කල්බදු ගිවිසුම් අංකය : 68100201900274700				
	වාහන වර්ගය : හොන්ඩා සිආර්වී				
	27.06.2019 දිනට ශේෂය			15,764,340	
	වර්ෂය තුල ගෙවන ලද වාරික			(1,839,173)	
	2019.12.31 දිනට ශේෂය			13,925,167	
	පොළී අවලම්භණය				
	2019.06.27 දිනට ශේෂය			3,964,340	
	වර්ෂය තුල ගෙවන ලද පොළිය			(798,009)	
	2019.12.31 දිනට ශේෂය			3,166,331	
	ජංගම නොවන කල්බදු වගකීම්				
	කල්බදු වගකීම			10,758,836	
	පොළී අවලම්භණය			(1,963,235)	
	2019.12.31 දිනට ශේෂය			8,795,601	
17	**ප්‍රාග්ධන ප්‍රදානය**				
	ප්‍රාග්ධන ප්‍රදානය - කාර්මික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය				
	ස්ථාවර වත්කම් අත්කර ගැනීම	**වටිනාකම**	**ගැලපීම්**	**ක්‍රමක්ෂය**	**ශේෂය**
	ගොඩනැගිල්ල	13,365,794		6,634,013	6,731,781
	වතුර මල	11,190,627		5,595,314	5,595,313
	පරිගණක	15,449,850	291,000	14,533,928	624,922
	කාර්යාලීය උපකරණ	44,958,211		41,951,801	3,006,410
	ඉගැන්වීමේ උපකරණ	174,760,907		158,528,810	16,232,097
	ගෘහභාණ්ඩ හා වැද්දුම්	31,558,455		28,792,667	2,765,788
	පුස්තකාල ග්‍රන්ථ	10,276,876		8,408,353	1,868,523
	එකතුව	301,560,720	291,000	264,444,886	36,824,834
	ප්‍රාග්ධන ප්‍රදානය - මහා භාණ්ඩාගාරය				
		වටිනාකම	**ක්‍රමක්ෂය**	**ශේෂය**	
	ස්ථාවර වත්කම් අත්කර ගැනීම				
	මෝටර් වාහන	25,150,000	19,263,333	5,886,667	
	එකතුව	25,150,000	19,263,333	5,886,667	
	ප්‍රාග්ධන ප්‍රදානය - ජී.ඕ.පී.ඒ.				
		වටිනාකම	**ක්‍රමක්ෂය**	**ශේෂය**	
	ස්ථාවර වත්කම් අත්කර ගැනීම				
	ගෘහභාණ්ඩ හා වැද්දුම්	18,600	16,740	1,860	
	එකතුව	18,600	16,740	1,860	
	ප්‍රාග්ධන ප්‍රදානය - තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය				
	ස්ථාවර වත්කම් අත්කර ගැනීම	**වටිනාකම**	**ක්‍රමක්ෂය**	**ශේෂය**	
	ඉඩම් හා ඉඩම් වැඩිදියුනුකිරීම්	2,361,079		2,361,079	
	ගොඩනැගිල්ල	234,528,687	105,419,012	129,109,675	
	වාහන	758,245	279,077	479,168	
	ඉගැන්වීමේ උපකරණ	6,018,283	5,712,542	305,741	
	පරිගණක	79,850	79,850	-	
	කාර්යාලීය උපකරණ	67,300	-	67,300	

	එකතුව	243,813,444	111,490,481	132,322,963	
	ප්‍රාග්ධන ප්‍රදානය - තෘතියික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්මේන්තුව				
		වටිනාකම	**ගැලපීම්**	**ක්‍රමක්ෂය**	ශේෂය
	ස්ථාවර වත්කම් අත්කර ගැනීම				
	ඉඩම්	595,500,000			595,500,000
	ගොඩනැගිල්ල	161,003,908		72,395,200	88,608,708
	කාර්යාලීය උපකරණ	80,401	29,252	96,718	12,935
	පිරියත හා යන්ත්‍රෝපකරණ	44,792		44,792	-
	ගෘහභාණ්ඩ හා වැද්දුම්	2,890,404	468,802	2,887,670	471,536
	ඉගැන්වීමේ උපකරණ	13,789,614		12,903,659	885,955
	පරිගණකය	170,432		165,286	5,146
	වෙනත් වත්කම්	5,806		5,806	-
	එකතුව	773,485,357	498,054	88,499,131	685,484,280

මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා				
ප්‍රාග්ධන ප්‍රදානය - නෝරාඩ				
	වටිනාකම	**ගැලපීම්**	**ක්‍රමක්ෂය**	**ශේෂය**
ස්ථාවර වත්කම් අත්කර ගැනීම				
කාර්යාලීය උපකරණ	306,823	111,629	369,089	49,363
පරිගණකය	4,479		4,479	
ගෘහභාණ්ඩ හා වැද්දුම්	1,086	244	1,222	108
වෙනත් වත්කම්	317,986	815	318,441	360
එකතුව	630,374	112,688	693,231	49,831
ප්‍රාග්ධන ප්‍රදානය - නිපුනතා සංවර්ධන ව්‍යාපෘතිය				
	වටිනාකම	**ගැලපීම්**	**ක්‍රමක්ෂය**	**ශේෂය**
ස්ථාවර වත්කම් අත්කර ගැනීම				
කාර්යාලීය උපකරණ	1,033,344	294,962	1,025,196	303,110
පරිගණකය	1,406,234	(722,518)	652,544	31,172
ගෘහභාණ්ඩ හා වැද්දුම්	865,492	158,888	887,860	136,520
ඉගැන්වීමේ උපකරණ	15,796,981		14,732,544	1,064,437
වෙනත් වත්කම්	276,160	92,524	314,817	53,867
එකතුව	19,378,211	(176,144)	17,612,961	1,589,106
ප්‍රාග්ධන ප්‍රදානය - ඩබ්.යූ.එස්.ඊ.				
		වටිනාකම	**ක්‍රමක්ෂය**	**ශේෂය**
ස්ථාවර වත්කම් අත්කර ගැනීම				
පරිගණක		1,263,750	1,263,750	
එකතුව		1,263,750	1,263,750	
ප්‍රාග්ධන ප්‍රදානය - මූදල් අමාත්‍යාංශය				
		වටිනාකම	**ක්‍රමක්ෂය**	**ශේෂය**
ස්ථාවර වත්කම් අත්කර ගැනීම				
පරිගණක		11,000	4,124	6,876
එකතුව		11,000	4,124	6,876
ප්‍රාග්ධන ප්‍රදානය - නිපුණතා සංවර්ධන අංශය				
		වටිනාකම	**ක්‍රමක්ෂය**	**ශේෂය**
ස්ථාවර වත්කම් අත්කර ගැනීම				
නොනිමි වැඩ		158,167,194		158,167,194
ගොඩනැගිල්ල		6,992,138	1,753,979	5,238,159
පිරියත හා යන්ත්‍රෝපකරණ		5,496,450	1,925,259	3,571,191
කාර්යාලීය උපකරණ		1,322,720	661,360	661,360
පරිගණක		5,780,849		5,780,849
ගෘහභාණ්ඩ හා වැද්දුම්		537,342	268,671	268,671
ඉගැන්වීමේ උපකරණ		2,425,999	1,219,333	1,206,666
වෙනත් වත්කම්		2,002,336	1,825,231	177,105
අස්පෘශ්‍ය වත්කම් - ගිණුම් මෘදුකාංග		1,320,000		1,320,000
එකතුව		184,045,028	7,653,833	176,391,195

ප්‍රාග්ධන ප්‍රදාන - ජී.අයි.ඉසඩ්			
ස්ථාවර වත්කම් අත්කර ගැනීම			
කාර්යාල උපකරණ	66,000	16,184	49,816
එකතුව	66,000	16,184	49,816
ප්‍රාග්ධන ප්‍රදාන - ඩයිකින්			
	වටිනාකම	**ක්‍රමක්ෂය**	**ශේෂය**
ඉගැන්වීමේ උපකරණ	1,699,588	140,158	1,559,430
	1,699,588	140,158	1,559,430

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2019	2018
විලම්බිත ආදායම		
2019.01.01 දිනට ශේෂය	587,909,221	506,574,654
වර්ෂය සඳහා ප්‍රාග්ධන දායකත්වය - මහා භාණ්ඩාගාරය	77,282,010	129,611,541
වර්ෂය සඳහා ක්ෂය / ක්‍රමක්ෂ ගැලපීම	(64,368,531)	(48,276,974)
2019.12.31 **දිනට ශේෂය**	600,822,700	587,909,221
මුළු ප්‍රාග්ධන ප්‍රධාන	1,640,989,558	1,659,079,504

18	**සමුච්චිත අරමුදල**		
	2019.01.01 දිනට ශේෂය	(3,563,532)	(12,365,315)
	ක්‍රමක් ක්ෂය/ගැලපුම වර්ෂය සඳහා	-	(1,831,091)
	ගැලපීම්	3,106,895	
	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙන් මාරුකරන ලද අතිරික්තය/ (හිඟය)	(25,112,634)	10,632,874
	2018.12.31 **දිනට ශේෂය**	(25,569,271)	(3,563,532)
	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2019	2018
19	**වෙනත් අරමුදල්**		
	පුස්තකාල සංවර්ධන අරමුදල	128,700	111,600
	විශ්වවිද්‍යාලීය සංවර්ධන අරමුදල	170,485	170,485
	කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල	3,812	3,812
	විශ්වවිද්‍යාලීය අරමුදල - විශේෂඥ උපදේශ සේවාවන්	316,315	316,315
		619,312	602,212
20	**නිපුණතා ක්ෂේත්‍ර සංවර්ධන ප්‍රදානය**		
	පුනරාවර්තන දායකත්වයන්	21,461,960	47,869,094
		21,461,960	47,869,094
21	**අධ්‍යයන කටයුතු වලින් ආදායම**		
	පාඨමාලා ගාස්තු		
	විඩියෝ නිෂ්පාදන තාක්ෂණවේදී ජාතික ඩිප්ලෝමාව	400	
	තාක්ෂණික ගුරු අධ්‍යාපනවේදය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	6,000	17,500
	රේඛීය නොවන සංස්කරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	400	
	රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණවේදී පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	15,200	
	රූපවාහිනී පස්චාත් නිෂ්පාදන තාක්ෂණවේදී පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	400	
	ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	15,600	
		38,000	17,500
	විශේෂඥ උපදේශකත්ව ආදායම		
	උපදේශකත්ව පුහුණුව		66,000
	උපදේශකත්ව විෂයමාලාව	2,000	
	උපදේශකත්ව සේවා		-
	උපදේශකත්ව වෙනත්	1,369,972	1,697,000
		1,371,972	1,763,000
	අධ්‍යයන කටයුතුවලින් මුළු ආදායම	1,409,972	1,780,500
22	**අධ්‍යයන කටයුතු මත ඍජු වියදම**		
	විශේෂඥ උපදේශකත්ව ගෙවීම්		
	පුහුණු කිරීම්	3,036	-
	සේවා		-
	වෙනත්	273,805	243,092
		276,841	243,092
	අධ්‍යයන කටයුතු මත මුළු ඍජු වියදම	276,841	243,092

23	**උපාධි වැඩසටහන වෙතින් ආදායම**	33,083,300	20,705,500
	බී.එඩ්. තාක්ෂණ උපාධි වැඩසටහන	293,200	776,000
	බී.ටෙක්. තාක්ෂණ උපාධි වැඩසටහන		
	මෘදුකාංග තාක්ෂණවේදය - අර්ධ කාලීන	1,821,400	1,204,100
	මෘදුකාංග තාක්ෂණවේදය - පූර්ණ කාලීන	706,000	398,700
	ජාල තාක්ෂණවේදය		
	ජාල තාක්ෂණවේදය - පූර්ණ කාලීන	636,000	323,400
	ජාල තාක්ෂණවේදය - අර්ධ කාලීන	1,517,200	820,400
	ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය		
	ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය - පූර්ණ කාලීන	504,000	258,400
	ගොඩනැගිලි සේවා තාක්ෂණවේදය - අර්ධ කාලීන	1,909,000	1,354,400
	නිෂ්පාදන තාක්ෂණවේදය		
	නිෂ්පාදන තාක්ෂණවේදය - පූර්ණ කාලීන	330,000	169,600
	නිෂ්පාදන තාක්ෂණවේදය - අර්ධ කාලීන	852,500	474,400
	බහුමාධ්‍යක තාක්ෂණවේදය - පූර්ණ කාලීන	433,200	432,400
	බහුමාධ්‍යක තාක්ෂණවේදය - අර්ධ කාලීන	1,914,100	897,600
	යාන්ත්‍රවිද්‍යුත තාක්ෂණවේදය		
	යාන්ත්‍රවිද්‍යුත තාක්ෂණවේදය - පූර්ණ කාලීන	365,800	190,000
	යාන්ත්‍රවිද්‍යුත තාක්ෂණවේදය - අර්ධ කාලීන	1,792,800	1,356,400
	ආහාර තාක්ෂණවේදය - පූර්ණ කාලීන	294,800	110,400
	ආහාර තාක්ෂණවේදය - අර්ධ කාලීන	1,938,000	1,572,800
	චිත්‍රපට හා රූපවාහිනී නිර්මාණ අධ්‍යයනය - අර්ධ කාලීන	839,800	578,800
	කර්මාන්ත කළමනාකරණය		
	කර්මාන්ත කළමනාකරණය - පූර්ණ කාලීන	240,800	144,000
	කර්මාන්ත කළමනාකරණය - අර්ධ කාලීන	1,642,400	534,100
	ඉදිකිරීම් තාක්ෂණවේදය හා පර්යේෂණ කළමනාකරණ		
	ඉදිකිරීම් තාක්ෂණවේදය හා පර්යේෂණ කළමනාකරණ - පූර්ණ කාලීන	197,600	91,200
	ඉදිකිරීම් තාක්ෂණවේදය හා පර්යේෂණ කළමනාකරණ - අර්ධ කාලීන	2,536,600	1,455,600
	ප්‍රමාණ සමීක්ෂණය - පූර්ණ කාලීන		
	ප්‍රමාණ සමීක්ෂණය - අර්ධ කාලීන	3,028,600	3,166,000
	බී.ටෙක් - හෝටල් කළමනාකරණය - පූර්ණ කාලීන	192,000	
	මාධ්‍යකලා නිෂ්පාදන	80,000	
	ඉංග්‍රීසි භාෂා ඉගෙන්වීම - අර්ධ කාලීන	1,846,400	1,139,600
	ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම	268,600	97,200
	බී.එඩ්. හා බී.ටෙක්. උපාධි ලියාපදිංචි ගාස්ත්‍ර	6,902,500	3,160,000
		32,790,100	19,929,500

මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්

	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2019	2018
24	**වෙනත් ආදායම්**	**රුපියල්**	**රුපියල්**
	ණය පොළිය	253,301	231,527
	ප්‍රවාහනය		
	විවිධ	1,745,607	3,187,372
	ස්ථිර තැන්පතු පොළිය	4,401,975	3,382,023
	කැඳවුම් තැන්පතු පොළිය	490,611	225,179
	ගර්භිත වත්කම් අලෙවියෙන් ලත් ආදායම්	102,460	-
	පොදුකාර්ය ගාස්තු	151,130	1,746,300
	උපාධි ලෝගු ආදායම	-	8,000
	විඩියෝ / උපකරණ කුලියට දීම		
	පරිශ්‍රය භාවිතා කිරීම	110,000	1,069,250
	දේශන ශාලා	10,625	681,013
	ශ්‍රවනාගාරය	36,562	41,907
	නිලනිවාස	1,447,146	1,241,478
	නේවාසිකාගාරය	1,795,506	2,242,239
		10,544,923	14,056,288

	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා												
25	විලම්බිත ආදායම ක්‍රමක්ෂය කිරීම												
	ස්ථාවර වත්කම් අත්කර ගැනීම	මහා භාණ්ඩා-ගාරය	ටී.ඊ.ඩී.පී.. ප්‍රදානය	භාණ්ඩා-ගාර ප්‍රදානය	ජී.ඕ.පී.ඒ. ප්‍රදානය	අමාත්‍යාංශ ප්‍රදානය	ඩී.ටී.ඊ.ටී. ප්‍රදානය	නොරාඩ් ප්‍රදානය	එස්.ඩී.පි. ප්‍රදානය	එස්.ඩී.ඩී. ප්‍රදානය	ජි.අයි.ඉසඩ්	ඩයිකින්	එකතුව
	ගොඩනැගිලි	5,521,009	668,290			11,760,723	9,049,400			349,607			27,349,029
	වතුර මල		559,531										559,531
	මෝටර් වාහන	3,121,032		2,274,167									5,395,199
	පරිගණක	12,742,449											12,742,449
	කාර්යාල උපකරණ	504,346	2,640,287				16,317	62,266	164,528	132,272	6,600		3,346,616
	ඉගැන්වීමේ උපකරණ	12,455,089	11,183,357				678,929		775,604	242,600		140,158	25,475,737
	ගෘහ භාණ්ඩ හා වැද්දුම්	3,267,842	1,159,260		1,860		261,497	136	88,628	53,734			4,832,957
	වෙනත් වත්කම්	1,318,525				305,742		455	67,948	44,276			1,736,946
	පිරියත හා යන්ත්‍රෝපකරණ	14,924,570								549,545			15,474,215
	පුස්තකාල ග්‍රන්ථ	565,382	934,261										1,499,643
	අස්පෘශ්‍ය වත්කම්	381,556											381,556
	පුනරුත්ථාපනය හා වැඩිදියුණු												
	ගොඩනැගිල්ල	8,252,116											8,252,116
	ප්‍රධාන ගොඩනැගිල්ල	880,058											880,058
	කාර්යාලීය උපකරණ	538,634											538,634
	වෙනත් වත්කම්	52,892											52,892
	පිරියත හා යනත්‍රෝපකරණ	15,705											15,705
	මෘයිම් තාප්ප	43,724											43,724
	අස්පෘශ්‍ය වත්කම්	1,133,333											1,133,333
	එකතුව	65,718,262	16,964,986	2,274,167	1,860	12,066,465	10,006,143	62,857	1,096,708	1,372,134	6,600	140,158	109,710,340

මූල්ය ප්රකාශයන්ට සටහන්

	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2019	2018
		රුපියල්	රුපියල්
26	**සේවක පිරිවැය**		
	වැටුප් හා වේතන	107,123,808	79,690,440
	ජීවන වියදම් දීමනාව	16,812,427	15,687,360
	අතුරු දීමනාව	814,495	1,075,638
	සේවක අර්ථසාධක අරමුදල් දායකත්වයන්	23,966,686	16,836,479
	සේවක භාරකාර අරමුදල් දායකත්වයන්	5,991,672	4,209,120
	උපකුලපති සංග්රහ දීමනාව	216,459	171,584
	සංග්රහ දීමනා	527,303	416,603
	පාරිතෝෂික ගෙවීම	29,178	(132,561)
	වෙනත් දීමනා	1,302,175	1,848,325
	අතිකාල	6,211,490	5,230,423
	නිවාඩු දින වැඩ සඳහා ගෙවීම්	382,962	282,917
	දීමනා - පාලක සභාව	258,000	336,000
	දීමනා - ප්රවාහන	250,846	314,823
	දීමනා - කාර්යමණ්ඩල දීමනා	2,000,000	2,400,000
	දීමනා - වෙනත්	148,500	125,600
	විද්වත් දීමනාව	56,160,185	32,556,318
	පර්යේෂණ දීමනාව	12,015,448	8,550,526
	විශේෂ දීමනාව	1,211,667	1,840,000
	අමතර දීමනා	19,182,084	12,694,013
	මාසික හානිපුරක දීමනා	25,328,968	16,502,966
	ගැලපුම් දීමනාව	831,076	4,208,610
		280,765,429	204,845,184
27	**ගමන් වියදම්**		
	දේශීය		
	ගමන් වියදම්	66,856	65,879
	සංයුක්ත දීමනා		
	විදේශීය		
	ගුවන් ගාස්තු	-	134,400
	සංයුක්ත දීමනා	22,000	-
	අනියම් දීමනා	254,609	88,449
	උණුසුම් ඇඳුම් දීමනා	17,627	66,183
	වෙනත්	35,918	13,800
		397,010	368,711
28	**සැපයුම් හා අවශ්ය දේ**		
	ලිපිද්රව්ය - පරිපාලන	2,694,920	1,790,205
	කාර්යාලයට අවශ්ය දේ		
	කාර්යාලයේ යන්ත්රවල පරිභෝජන ද්රව්ය	1,719,656	1,339,440
	ඉන්ධන ප්රතිපාදනය (උපකුලපති)	303,892	329,866
	ඉන්ධන ප්රතිපාදනය (අධ්යක්ෂ ජනරාල්)	239,850	289,286
	ඉන්ධන ප්රතිපාදනය (පීඨාධිපති පූහුණු තාක්ෂණ)	192,120	190,560
	ඉන්ධන ප්රතිපාදනය (පීඨාධිපති කර්මාන්ත හා පූහුණු තාක්ෂණ)	192,120	190,560
	ඉන්ධන ප්රතිපාදනය (නිලවාහන සංචිතය)	1,187,372	965,181
	ඉන්ධන ප්රතිපාදනය (විදුලි ජනකය)	585,376	258,559
	ඉන්ධන ප්රතිපාදනය (අධ්යක්ෂ - ජනමාධ්ය)	61,320	190,560
	ඉන්ධන ප්රතිපාදනය (අධ්යක්ෂ - මුදල්)	191,880	190,560
	ඉන්ධන ප්රතිපාදනය (අධ්යක්ෂ - ඒ.ඒ.ක්ෂූ)	192,120	190,560
	මුද්රණ පරිපාලනය		
	මුද්රණ අධ්යනය		
	උපකුලපති/අධ්යක්ෂ ජනරාල්/ පාලක මණ්ඩලය සංග්රහ දීමනා		964
	නිලඇඳුම්	120,000	108,000
	වෛද්ය සැපයුම්	17,060	7,938
	විවිධ පරිභෝජන ද්රව්ය	1,001,624	469,198
		8,699,219	6,511,437

මූල්ය ප්රකාශයන්ට සටහන්

	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2019	2018
		රුපියල්	රුපියල්
29	**වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව**		
	වාහන		
	WPKH 6725 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා)	54,559	150,313
	301-1501 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා)	47,170	44,210
	19-6866 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා)	150	2,800
	62-3743 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා)	178,986	123,830
	62-4816 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා)	90,012	180,548
	NA-2503 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා)	224,079	184,093
	KO-4860 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා)	105,075	137,267
	KR-1801 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා)	247,031	83,879
	KR-7781 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා)	113,475	59,381
	NB-3149 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා)	363,085	154,109
	ND-5057 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා)	27,130	8,300
	සිබීඑච් 3320 (සේවා, ටයර්, බැටරි හා සුළු අළුත්වැඩියා)	48,314	
	පිරියත, යන්ත්ර හා උපකරණ		
	පරිගණක හා උපාංග	756,825	193,216
	ඡායා පිටපත් හා වායු සමන යන්ත්ර සහ විදුලි සෝපාන	2,951,353	2,262,908
	ඉගැන්වීමේ උපකරණ	640	218,255
	විදුලි ජනකය	-	69,544
	කාර්යාල උපකරණ	27,140	61,480
	වෙනත්	170,595	900,002
	ගොඩනැගිලි වියුහය		
	ස්ටුඩියෝ	13,596	
	නේවාසිකාගාරය	25,313	215,633
	කාර්ය මණ්ඩල නිලනිවාස	886,643	681,338
	අබන්ඩ අධ්යනය කේන්ද්රය	-	22,000
	වෙනත්	601,816	652,392
	භෝජනාගාරය	-	77,160
		6,934,987	6,482,658
30	**සේවා**		
	ප්රවාහන		
	වාහන කුලිය	15,066	198,199
	තැපැල් ගාස්තු	163,910	295,770
	දුරකථන	1,536,730	1,825,828
	අන්තර්ජාල සේවය	6,526,307	6,200,271
	නෛතික ගාස්තු	631,250	702,500
	කුවිතාන්සි සඳහා මුද්දර		-
	තැපැල් හා සංනිවේදන - වෙනත්	450	1,110
	විදුලිය	12,590,691	12,348,598
	ජලය	1,706,246	1,994,989
	කුලිය		48,000
	බදු	61,243	121,583
	රක්ෂණ හා ලියාපදිංචි ගාස්තු	607,485	498,472
	විෂයමාලා සංවර්ධනය	148,475	45,060
	ආරාධිත කථිකාචාර්ය ගාස්තු	30,949,212	22,439,148
	ශිෂ්ය ශිෂ්යාවන් සඳහා ශිෂ්යත්ව		-
	සංස්ථාමය සාමාජීය වගකීම	461,046	291,969
	ඉගෙනුම් ද්රව්ය	163,071	1,738,473
	ප්රදානෝත්සව/ උපාධි ප්රදානෝත්සවය	2,278,900	32,842
	ප්රවාරය (වෙළඳ ප්රවාරණය)	4,625,173	1,633,505
	කාර්ය මණ්ඩල සංවර්ධනය	717,990	2,230,459
	ප්රකාශන	173,600	-
	පුවත්පත් හා වාර සඟරා	321,956	299,238
	උත්සව අවස්ථා හා පරිත්යාග	4,900	13,900

	ගොඩනැගිලි භාරකාර සේවාව	9,206,001	7,121,405
	ආරක්ෂක සේවය	11,001,276	8,711,823
	සහභාගිකයින් සඳහා ආහාර	1,187,089	1,373,494
	ප්‍රදර්ශන	2,338,522	884,652
	පර්යේෂණ	782,361	454,606
	පරිවර්තන	104,080	-
	සාමාජිකත්වය	173,017	343,857

මූල්‍ය ප්‍රකාශයන්ට සටහන්

	දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	2019	2018
		රුපියල්	**රුපියල්**
	මෘදුකාංග යාවත්කාලීන කිරීම	941,905	354,583
	මූල්‍ය සහ වෙනත් ගාස්තු	798,309	250
	විගණන ගාස්තු	969,403	
	කර්මාන්ත පුහුණුව	27,009	43,350
	සාමාජීය අලෙවිකරණය	137,838	735,136
	විවිධ	663,444	452,679
		92,313,955	73,435,749
31	ක්ෂය සහ ක්‍රමක්ක්ෂය		
	ක්ෂය - ස්ථාවර වත්කම් අත්කර ගැනීම		
	ගොඩනැගිලි	27,438,137	27,422,986
	වතුර මල	559,531	559,531
	මෝටර් වාහන	4,780,447	3,723,721
	කල්බදු වාහන	1,539,752	
	පරිගණක	12,742,449	13,107,255
	ගෘහභාණ්ඩ හා වැද්දුම්	4,895,468	6,140,986
	කාර්යාලීය උපකරණ	3,380,545	5,069,763
	ඉගැන්වීම් උපකරණ	25,820,579	28,913,806
	ග්‍රන්ථ	1,499,792	3,762,992
	පිරියත හා යන්ත්‍රෝපකරණ	15,551,119	7,163,561
	වෙනත් වත්කම්	1,516,068	2,401,485
		99,723,887	98,266,086
	ක්ෂය - ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය		
	ගොඩනැගිලි	8,603,462	6,009,505
	ප්‍රධාන ගොඩනැගිල්ල	880,058	880,058
	පරිගණක		
	මෝටර් වාහන		30,448
	ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ	538,634	538,634
	පිරියත හා යන්ත්‍රෝපකරණ	15,705	15,705
	වෙනත් වත්කම්	52,892	48,786
	මායිම් තාප්ප	43,724	43,724
	ග්‍රන්ථ		-
		10,134,475	7,566,860
	කාලපරිච්ඡේදය සඳහා මුළු ක්ෂය	109,858,362	105,832,946
	ක්‍රමක්ෂය		
	ක්‍රමක්ෂය - **ස්ථාවර වත්කම් අත්කර ගැනීම**		
	අස්පෘශ්‍ය වත්කම්	381,556	508,333
	ක්‍රමක්ෂය - **ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය හා දියුණු කිරීම**		
	අස්පෘශ්‍ය වත්කම්	1,133,333	1,133,333
	කාලපරිච්ඡේදය සඳහා මුළු ක්‍රමක්ෂය	1,514,889	1,641,666
	මුළු ක්ෂය හා ක්‍රමක්ෂය	111,373,251	107,474,612
32	**මෙහෙයුම් වියදම් - නිපුනතා සංවර්ධන අංශය**		
	විද්වතුන් සඳහා කෙටිකාලීන පාඨමාලා	291,654	546,899
	තක්සේරුකාර පුහුණුව	1,822,641	1,913,622

	උපාධි ප්‍රධානොත්සව	-	562,904
	විදේශීය පුහුණුව		
	ජාතික නිපුණතා සුදුසුකම් 5 තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණුකරුවන් සඳහා	1,337,329	3,059,318
	විෂයමාලා සංවර්ධනය	1,625,400	4,818,374
	නව බදවාගැනීම්	-	13,337,404
	තත්ත්ව සහතික ඒකකය	552,581	717,173
	විෂයමාලා සංවර්ධන කර්මාන්තය	-	570,140
	කර්මාන්ත පුහුණු කළමනාකරණය	-	526,134
	සාමාජීය අලෙවිකරණය	3,912,840	5,884,124
	පශ්චාත් උපාධිධාරීන්	1,391,340	6,668,761
	අයි.ඉ.එස්.එල්. පිළිගැනීම ලබාගැනීම	376,430	287,851
	උපදේශන ගෙවීම් - ඩී.බී	3,042,795	4,550,225
	ආයතනික සම්බන්ධීකාරක ගෙවීම්	1,167,184	1,592,787
	ධාරිතා වර්ධනය	-	2,833,378
	ගුරුපුහුණු වැඩසටහන - අභ්‍යන්තර	4,267,339	
	ගුරුපුහුණු වැඩසටහන - බාහිර	1,674,427	
	මුළු මෙහෙයුම් වියදම්	21,461,960	47,869,094

11. විගණන වාර් තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } විටිවයි/බී/යුවිටි/එෆ්ජ්/2019/07

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2020 සැප්තැම්බර් 23 දින

UNIVOTEC
RECEIVED
28 SEP 2020
FINANCE DIVISION

උපකුලපති,

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් - 1. ලේකම්- අධ්‍යාපන අමාත්‍යාංශය

2. ලේකම්- මුදල් අමාත්‍යාංශය.

මගේ අංකය / எனது இல. / My No. } වීටීවයි/බී/යූවීටී/එෆ්ජ්/2019/07 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 සැප්තැම්බර් 23 දින

UNIVOTEC RECEIVED 28 SEP 2020 FINANCE DIVISION

උපකුලපති,

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේදී සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය

සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම් වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනා ගැනීමේදී හා තක්සේරු කිරීමේ දී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම්, චේතනාන්විත මහ හැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇති වීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම් ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම් ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) 2011 අප්‍රේල් මාසයේදී අමාත්‍ය මණ්ඩලය මගින් අනුමැතිය ලබා දී තිබුණු වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණයක් හා දේශනශාලා සංකීර්ණයක් සහිත ගොඩනැගිල්ල ඉදිකිරීමට එම වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා භාණ්ඩාගාරයෙන් හා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් රු. මිලියන 434.9 ක් වෙන් කර දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 304 ක් වියදම් කර තිබුණ ද ගිණුම් වර්ෂය අවසාන වන විටත් ශබ්දාගාරය භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සඳහා වැඩහලක්, නේවාසිකාගාරයක් හා ආපනශාලාවක් ඉදිකිරීමට 2017 ජනවාරි 03 දින පැවති අමාත්‍ය මණ්ඩලය මගින් රු.මිලියන 927.34 ක ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලැබී තිබුණි. 2018 හා 2019 වර්ෂයන්හිදී අයවැය මඟින් එකතුව රු. මිලියන 268 ක් වෙන් කර දී තිබූ අතර 2018 වර්ෂයේ දී රු. 23,600,993 ක් උපදේශන ගාස්තු ලෙස ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ කාර්යමණ්ඩලය 2009 ඔක්තෝබර් 12 දින වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමේදී 2009 ජූලි 27 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/E4/47/2/280/1 දරන ලිපියට පටහැනිව නිලධාරීන් 10 දෙනෙකු දරන්නාට පුද්ගලික වන සේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II තනතුරේ පිහිටුවා තිබුණු අතර, එම නිලධාරීන්ගෙන් 6 දෙනෙකු මෙනෙක් එම තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණි. එසේ නිබියදී වැටුප් විෂමතාවය ඉවත් කිරීම සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව පාලක මණ්ඩල නීරණයකට අනුව 2016 දෙසැම්බර් 05 දිනැති අංක 17/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ

වක්‍රලේඛයට අනුව 2016 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව 2016 ජනවාරි සිට 2019 සැප්තැම්බර් දක්වා හිඟ වැටුප්, අතිරේක දීමනා, අධ්‍යයන දීමනා, පර්යේෂණ දීමනා හා සංග්‍රහ දීමනා ලෙස එකතුව රු.5,638,012 ක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි.

(ඇ) අනුමත කාර්යමණ්ඩලය තුල නොමැති උපදේශක තනතුරු සඳහා පාලක මණ්ඩලයේ තීරණයක් මත කොන්ත්‍රාත් පදනමින් සමාලෝචිත වර්ෂය තුලදී අවස්ථා දෙකකදී නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන එකතුව රු. 2,726,253 ක් දීමනා ගෙවා තිබුණි.

(ඉ) 2014 ජනවාරි 22 දිනැති අංක DMS/1670 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලිපිය මගින් විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්යමණ්ඩලයට ඇතුලත් නොවූ උපදේශකවරුන් 6 දෙනෙකු හා විගණකවරයෙකු පත්කර තිබුණි. එම නිලධාරීන්ට 2017 ජූනි මාසයේ සිට 2019 ජූලි මාසය දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරමින් පත්වීම් ලබාදී එකතුව රු.9,903,309 ක උපදේශක ගාස්තු ගෙවා තිබුණි.

(ඊ) 2011 ජනවාරි 25 සිට 2012 ජූලි 31 දක්වා පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබූ සහකාර කථිකාචාර්යවරයෙකු අධ්‍යයන නිවාඩු කාලසීමාව අවසන් වීමෙන් පසුව සේවයට වාර්තා නොකිරීම නිසා ගිවිසුම කඩ කිරීම මත අයවිය යුතු රු. 1,553,825 ක් වූ බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

<u>වීටීවයි/බී/යූවීටී/එෆ්ඒ/2019/07 අංක දරණ හා (2020.09.23 දිනැති) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු.</u>

අංකය	විගණන විමසුම	පිළිතුරු
3.	**<u>අනෙකුත් විගණන නිරීක්ෂණ</u>**	
(අ)	2011 අප්‍රේල් මාසයේදී අමාත්‍ය මණ්ඩලය මගින් අනුමැතිය ලබා දී තිබුණු වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ බහුකාර්ය ශබ්දාගාර සංකීර්ණයක් හා දේශනශාලා සංකීර්ණයක් සහිත ගොඩනැගිල්ල ඉදිකිරීමට එම වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා භාණ්ඩාගාරයෙන් හා ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය මඟින් රු. මිලියන 434.9 ක් වෙන් කර දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 304 ක් වියදම් කර තිබුණ ද ගිණුම් වර්ෂය අවසාන වන විටත් ශබ්දාගාරය භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි.	මෙම ගොඩනැගිල්ලෙහි ශබ්දාගාර සංකීර්ණය හැර අනෙකුත් කොටස් ඉදිකිරීම් අවසන් කර දේශනශාලා භාවිතා කිරීම මේ වන විට සිදු වේ. ශබ්දාගාර සංකීර්ණයෙහි ඉදිකිරීම් වැඩ කරගෙන යන අතරතුර අරමුදල් ලබා දීමේ ගැටළුවක් හේතුවෙන් නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ දැනුම් දීම අනුව ඉදිකිරීම් කටයුතු නතර කරන ලදී. (ඇමණුම් අංක 01) මෙම ශබ්දාගාරය සඳහා දැනටමත් උපකරණ කොටසක් මිලදී ගැනීම හා ඉදිකිරීම් වලින් කොටසක් සිදුකර අවසන් බැවින්, එම දරන ලද වියදම්, ආයතනයේ අරමුණ සඳහා යොදා ගැනීම වෙනුවෙන් මෙම ශබ්දාගාරය භාවිතා කිරීමට හැකි තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. එහි වර්ථමාන තත්ත්වය පහත පරිදි වේ. **විස්තරය** — **වර්ථමාන තත්ත්වය** 01 — ගොඩනැගිල්ලෙහි ඉදිකිරීම් කටයුතු සිදුකිරීමේදී වැඩ අවසන් නොකලද බිත්ති නැවත කැඩී, ඉරිතැලී ඇත. — වාර්ථාවක් ඉල්ලා ඇත.

			02	ගොඩනැගිල්ලේ බිත්ති බැමි මත අතුරා ඇති පිහන් ගඩොල් ගැලවී ඇත.	සම්පූර්ණ කර ඇත.	
			03	ඉදිකිරීම් කටයුතු නිසා බිත්ති අපවිත්‍ර වී ඇත.	කොටසක් නිම කර ඇත.	
			04	සිවිලිම නිසි පරිදි සවි කර නොමැත.	මේ දක්වා කිසිදු පියවරක් ගෙන නොමැත.	
			05	වර්ෂාව පවතින දින වල වැසි ජලය ගොඩනැගිල්ලේ අභ්‍යන්තර බිත්ති මතට කාන්දු වේ.	සම්පූර්ණ කර ඇත.	
			06	නව නේවාසිකාගාරයේ කානුව කැඩී ඇත.	සම්පූර්ණ කර ඇත.	
			07	ගොඩනැගිල්ල ඉදිරිපිට සවිකර ඇති වැහි පීල්ල නිසි පරිදි සවි කර නොමැත.	සම්පූර්ණ කර ඇත.	
			08	රෝද පුටුව රැගෙන යාම සඳහා භාවිතා කරන ස්ථානයේ ආධාරක වැට ගැලවී ඇත.	සම්පූර්ණ කර ඇත.	
			09	කාමර නිසි පරිදි පිරිසිදු කල යුතුය.	කොටසක් සිදු කර ඇත.	
			10	වැසිකිළි වලට දොරගුලු සවි කර නොමැත.	සිදු කර නොමැත.	
			11	ප්‍රධාන සහ උප විදුලි පුවරුවේ පරිපථ සටහන් වැරදිය.	සිදු කර නොමැත.	
			12	ගලවා ඉවත් කර ඇති Paving නැවත සවි කර නැත.	සම්පූර්ණ කර ඇත.	
			13	Construction drawing සහ As-build drawing කිසිවක් මේ දක්වා භාර දී නොමැත.	සිදු කර නොමැත.	

(ආ)	විශ්වවිද්‍යාලය සඳහා වැඩහලක්, නේවාසිකාගාරයක් හා ආපනශාලාවක් ඉදිකිරීමට 2017 ජනවාරි 03 දින පැවති අමාත්‍ය මණ්ඩලය මගින් රු.මිලියන 927.34 ක ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලැබී තිබුණි. 2018 හා 2019 වර්ෂයන්හිදී අයවැය මඟින් එකතුව රු. මිලියන 268 ක් වෙන් කර දී තිබූ අතර 2018 වර්ෂයේ දී රු. 23,600,993 ක් උපදේශන ගාස්තු ලෙස ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.	අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විශ්වවිද්‍යාලය සඳහා වැඩහලක්, නේවාසිකාගාරයක් හා ආපන ශාලාවක් ඉදිකිරීම් කාර්යය සඳහා උපදේශන සේවා සැපයීම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යංශය (CECB) වෙත පවරා තිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව අදාල ගෙවීම් සිදුකර ඇත. විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් සම්බන්ධයෙන් උපකුලපති තුමා විසින් පත්කරන ලද උපකමිටුව (Subcommittee) මගින් වැඩහලක්, නේවාසිකාගාරයක් හා ආපනශාලාවක් යන ඉහත ගොඩනැගිලි තුන වෙනුවට ඉහත ගොඩනැගිලි තුනෙහි අපේක්ෂිත කාර්යයන් සඳහා තනි ගොඩනැගිල්ලක් ඉදිකිරීමට නිර්දේශ ඉදිරිපත් කරන ලද අතර එය උපකුලපති තුමා විසින් අනුමත කරන ලදී. මෙම ව්‍යාපෘතිය කැබිනට් මණ්ඩලය අනුමත ව්‍යාපෘතියක් වූ බැවින් ඉහත වෙනස් කම් සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ (Department of National Planning) නිර්දේශය සහිතව නැවත කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුව තිබුණි. ඒ අනුව අවශ්‍ය කටයුතු සිදුකරන ලද අතර එවකට අප අමාත්‍යාංශය වූ නිපුණතා හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයෙහි ලේකම් තනතුර කීප අවස්ථාවකදී වෙනස් වීම හා අවසානයේදී අමාත්‍යාංශය වෙනස්වීම යන කරුණු මෙම ව්‍යාපෘතියේ ප්‍රමාදයට සෘජුවම බලපෑ අතර මෙම වසරේ මාර්තු මස සිට අප රටට

		බලපෑ කොරෝනා වසංගත තත්ත්වය එය තවදුරටත් ප්‍රමාද වීමට හේතු විය. නැවත රට යතා තත්ත්වයට පත් වූ පසු 2020 ජූලි මස 08 වන දින පැවති කැබිනට් මණ්ඩල තීරණ අනුව ඉහත වෙනස්කම් සඳහා අනුමැතිය ලැබී ඇති අතර අදාල ඉදිකිරීම් කටයුතු සඳහා මුදල් ප්‍රතිපාදන 2021-2023 මධ්‍යකාලීන අයවැය රාමුව තුල සලසා ගන්නා ලෙස වැඩිදුරටත් උපදෙස් ලබා දී ඇත.
(ඇ)	ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ කාර්යමණ්ඩලය 2009 ඔක්තෝබර් 12 දින වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමේදී 2009 ජූලි 27 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/E4/47/2/280/1 දරන ලිපියට පටහැනිව නිලධාරීන් 10 දෙනෙකු දරන්නාට පුද්ගලික වන සේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II තනතුරේ පිහිටුවා තිබුණු අතර, එම නිලධාරීන්ගෙන් 6 දෙනෙකු මෙතෙක් එම තනතුර සඳහා අවශ්‍ය අවම සුදුසුකම් සම්පූර්ණ කර නොතිබුණි. එසේ තිබියදී වැටුප් විෂමතාවය ඉවත් කිරීම සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව පාලක මණ්ඩල තීරණයකට අනුව 2016 දෙසැම්බර් 05 දිනැති අංක 17/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛයට අනුව 2016 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණි. ඒ අනුව 2016 ජනවාරි සිට 2019 සැප්තැම්බර් දක්වා හිඟ වැටුප්, අතිරේක දීමනා, අධ්‍යයන දීමනා, පර්යේෂණ දීමනා හා සංග්‍රහ	මෙම නිලධාරීන් ශ්‍රීලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ දරන ලද තනතුරු හා එම ආයතනයේ ලබා තිබූ සේවා පළපුරුද්ද සලකා සහ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත අන්තර්ග්‍රහණයේදී, විශ්වවිද්‍යාලයක බඳවාගැනීමේදී තිබිය යුතු සුදුසුකම් සම්පූර්ණ කර නොතිබූ බැවින් ඔවුන් දරන්නාට පෞද්ගලික වන සේ එම තනතුරු පිරිනමා තිබූ අතර, 2016 දෙසැම්බර් 05 දිනැති සහ අංක 17/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයට අනුව ඔවුන්ගේ වැටුප් තල වල පිහිටවන ලෙස ඔවුන් කරන ලද ඉල්ලීමක් පාදක කර ගනිමින්, ඔවුන්ට අදාල වැටුප් පරිමාණය කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් ලබාදෙන තුරු, 93 වන පාලක මණ්ඩලය මගින් අදාල පරිවර්තනය සිදුකිරීමට එකඟත්වය ලබා දීමෙන් අනතුරුව, මෙසේ ගෙවීම් සිදු කර ඇත.

	දීමනා ලෙස එකතුව රු.5,638,012 ක් විශ්වවිද්‍යාලය විසින් ගෙවා තිබුණි.	
(ඈ)	අනුමත කාර්යමණ්ඩලය තුල නොමැති උපදේශක තනතුරු සඳහා පාලක මණ්ඩලයේ තීරණයක් මත කොන්ත්‍රාත් පදනමින් සමාලෝචිත වර්ෂය තුලදී අවස්ථා දෙකකදී නිලධාරීන් දෙදෙනෙකු බඳවාගෙන එකතුව රු. 2,726,253 ක් දීමනා ගෙවා තිබුණි.	වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අලුතින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන පහත සඳහන් උපාධි පාඨමාලාවන්හි ඇතුලත් විය යුතු වන විෂය මාලාව පිළියෙල කිරීම, මෙම උපාධි පාඨමාලා ආරම්භ කිරීම, එම උපාධි පාඨමාලා ආරම්භ කල පසු අදාල විෂයයන් සඳහා දේශන පැවැත්වීම යන කටයුතු සඳහා එම විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගේ දැනුම උපයෝගී කර ගැනීමෙන්, වඩා ඵලධායක හා ප්‍රයෝජනවත් විශේෂඥ සේවාවක් ලබා ගැනීමේ අරමුණින්, අනුමත මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාවෙහි ඇති පුරප්පාඩු සඳහා පාලක මණ්ඩල අනුමැතිය සහිතව මෙම අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජික දෙපලගේ, සේවය ලබා ගන්නා ලදී. • Bachelor of Quantity Surveying Technology-Revised Curriculum with fourth year • Bachelor of Media Arts Production Technology වෙනත් විශ්වවිද්‍යාලයන්හි සේවය කරන ලද, අදාල ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගේ දැනුම මෙම විශ්වවිද්‍යාලයේ උන්නතිය සඳහා යොදා ගැනීමේ අරමුණින් මෙසේ සිදු කරන ලදි.
(ඉ)	2014 ජනවාරි 22 දිනැති අංක DMS/1670 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලිපිය මගින් විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්යමණ්ඩලයට ඇතුලත් නොවූ උපදේශකවරුන් 6 දෙනෙකු හා	මෙම ආයතනය වෙත මෙම උපදේශකවරුන්ගේ සේවය ලබාගෙන ඇත්තේ කොන්ත්‍රාත් පදනම යටතේය. ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් අදාල උපදේශකවරුන් තෝරාගෙන ඇත. විශ්වවිද්‍යාල විද්‍යායතනයන් මෑතකදී ආරම්භ කරන ලද ආයතන වේ. ඒවායේ කාර්යමණ්ඩලයද අත්දැකීම් අඩු නවක පත්වීම්

	විගණකවරයෙකු පත්කර තිබුණි. එම නිලධාරීන්ට 2017 ජුනි මාසයේ සිට 2019 ජූලි මාසය දක්වා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරමින් පත්වීම් ලබාදී එකතුව රු.9,903,309 ක උපදේශක ගාස්තු ගෙවා තිබුණි.	ලද කාර්ය මණ්ඩලය වේ. විශ්වවිද්‍යාල විද්‍යායතනයන්හි පරිපාලන හා මූල්‍ය කටයුතු විශ්වවිද්‍යාලයකට ගැලපෙන පරිදි ස්ථාපිත කිරීම සඳහා විශ්වවිද්‍යාලයන්හි පරිපාලන හා මූල්‍ය අංශයන්හි අත්දැකීම් සහිත, විශ්වවිද්‍යාලයකින් විශ්‍රාම ලද නිලධාරීන්ගේ සේවය ලබා ගෙන ඇත. විශ්වවිද්‍යාල විද්‍යායතනයන් ද ඇතුළුව මෙම විශ්වවිද්‍යාලයේද අභ්‍යන්තර විගණන කටයුතු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක තනතුර සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා සිටි නමුත් එසේ අනුමැතිය නොලැබුණ බැවින්, අදාල කාර්යයන් ඉටු කර ගැනීම සඳහා මෙසේ කොන්ත්‍රාත් පදනම යටතේ අදාල සේවාවන් ලබා ගන්නා ලදි.

(ඊ)	2011 ජනවාරි 25 සිට 2012 ජූලි 31 දක්වා පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා වැටුප් සහිත විදේශ අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබූ සහකාර කථිකාචාර්යවරයෙකු අධ්‍යයන නිවාඩු කාලසීමාව අවසන් වීමෙන් පසුව සේවයට වාර්තා නොකිරීම නිසා ගිවිසුම කඩ කිරීම මත අයවිය යුතු රු. 1,553,825 ක් වූ බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.	උක්ත නිලධරයා සේවය හැර ගිය අයෙකුසේ සළකා කටයුතු කරන ලද බැවින් ඒ සම්බන්ධයෙන් ඔහු කම්කරු විනිශ්චය සභාවේ කරන ලද පැමිණිල්ල විභාග වීමෙන් අනතුරුව ඔහු විදේශ ගතවීමට ප්‍රථම විශ්වවිද්‍යාලය සමග එළඹී ගිවිසුමේ කොන්දේසි කඩ කිරීම මත විශ්වවිද්‍යාලයට අයවිය යුතු මුදල් සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2015.05.07 දිනැතිව යොමු කරන ලදී. මේ වන විට අදාල පැමිණිල්ල ගල්කිස්ස දිසා අධිකරණයට ඉදිරිපත් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2020.08.12 දිනැති ලිපිය මඟින් විශ්වවිද්‍යාලය වෙත යොමු කොට ඇති අතර එම පැමිණිල්ල හා ඊට අදාල ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව විසින් නම් කර ඇති නීතිඥවරිය වෙත භාරදීමට කටයුතු කොට ඇත.

පිළියෙල කිරීම - .....
ආර්.ඒ.එන්.ඩී.රූපසිංහ
අභ්‍යන්තර විගණක

පරීක්ෂා කිරීම - .....
නිල්මිණි දියබෙදනගේ
අධ්‍යක්ෂ ජනරාල්

අත්සන් කිරීම - .....
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා
උපකුලපති

දිනය - 2020.10.19